# ANANDAYA ආනන්දය

2023 November 2023 ඉල්

Published by Ananda College Old Boys' Association



සව්සත වෙතම පතුරන මෙත් සිත කරුණා
තිලොවට තිලක බුදුරුව සුරකින සොඳිනා
සුවහස් අනඳ පුතුනට ආසිරි සදනා
වෙහෙර වැඳිමු අප සැම යළි පණ ලබනා

**නීතීඥ ශෂික ජයතිලක**



I learnt to appreciate the importance of academic excellence" and to build on my passions from a very young age'

- Prof. Buddhima Indraratna

Pg 04



ජීවිතය දිගු ඉගෙනුම් ක්‍රියාවලියක්. හැම දෙයින්ම අපි ඉගෙනගන්නවා.

-එයාර් මාෂල් උදේනි රාජපක්ෂ

පිටුව 14



“ආනන්ද විද්‍යාලයේ අයිතිකරුවෝ කවුරුන්ද?”

- නිව්ටන් පුංචිහේවා

පිටුව 06

# කතුවැකිය

137 වසරක අනභිබවනීය සාඩම්බර ඉතිහාසයකට උරුමකම් කියන ජාතියේ නියමුවන්ගේ මහා නැණ ගුණ පෝෂකාගාරය වන ආනන්ද විදුහලේ සිප් සතර හැදෑරූ ආදි විද්‍යාර්ථීන්ගේ එකමුතුව හෙවත් වසර 115ක් ඉපැරණි ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ නිල මුද්‍රිත ප්‍රකාශන සංග්‍රහය වන "ආනන්දය" පුවත් සඟරාව සෑම වසරකම මාර්තු සහ නොවැම්බර් ලෙස කලාප දෙකකින් එළිදක්වන අතර, අප සංගමයේ ප්‍රමුඛතම වාර්ෂික ක්‍රියාකාරකමක් වන "ඕල්කට් සමරු දෙසුම"ට සමගාමී ව ඔබ වෙත පිදෙන මෙම කලාපයට පළමුව සුභාශිංෂන එක් කරන්නේ හදපිරි ගෞරවනීය හැඟීමකිනි.

අනඳ ඉතිහාසයේ අභිමානවත් පැතිකඩයන් අතීත මතකාවර්ජනයන් තුලින් වත්මනට කියා පෑමත් විද්‍යාලයීය සිසු-ආදි සිසු ජයග්‍රහණ පිළිබඳව මෙන්ම විදුහල තුල අනුල්ලංඝනීයව පවත්වාගෙන එනු ලබන ක්‍රීඩා හා සමිති සමාගම් පිළිබඳ විස්තර වාර්තාවක් ඉදිරිපත් කිරීමත්, විශේෂයෙන්ම මේ වසරේදී ඕල්කට් සමරු දෙසුම පවත්වනු ලබන දේශකයා පිළිබඳ හැඳින්වීමක් මෙන්ම ආදි ශිෂ්‍ය මවු සංගමය සහ එහි අනුබද්ධිත කණ්ඩායම් මඟින් කළ කී දෑ පිළිබඳ වාර්තා කිරීමක් මෙම කලාපයෙහි අන්තර්ගත කිරීමට අපට හැකි වූ බැව් සතුටින් සිහිපත් කරනු කැමැත්තෙමු.

නව තාක්ෂණයට අනුකූලව මෙහි අඩංගු සාකච්ඡා ආදියෙහි වීඩියෝ පිටපත් නැරඹීමට QR කේත ඇසුරින් ඉඩසලසමින්ද, කාර්ය බහුල දිවි පෙවෙතට පහසුවක් ගෙන දෙමින් ලෝ පුරා විසිරී සිටින සමස්ත ආදි ආනන්දීය ප්‍රජාවටම තම අතැති ජංගම දුරකතනය හරහා වුවද එසැණින් කියවිය හැකි ඊ සඟරාවක් ලෙසින්ද එළිදක්වන මෙම "ආනන්දය" සඟරාව අද වන විට ආනන්දයේ එදා-අද හා හෙට යන කාලාත්‍රමය යා කරන රන් හුයක් මෙන් අප සදාදරණීය විදුමවුන්ගේ කිතුගොස නම් සළුපිළි මනා කොට ගෙත්තම් කිරීමට සමත්ව ඇතැයි කීම අතිශයෝක්තියක් නොවනු ඇත.

සාරගර්භ වූ පුවත් සඟරාවක් ලෙස "ආනන්දය" ඔබ වෙත පත්කිරීමට ප්‍රධාන සංස්කාරකවරයා ලෙස මටත් මගේ සහෘද සංස්කාරක මණ්ඩලයටත් නොමඳ දයාවෙන් මගපෙන්වූ අප සංගමයේ නියමුවාණන් වන මහාචාර්ය අතුල කලුආරච්චි සොයුරාටත්, අප අනුකමිටුවට නායකත්වය ලබාදෙන අප සංගමයේ උප සභාපතිවරයෙකු වන අසංග ප්‍රියදර්ශන සොයුරාටත්, අප අනු කමිටුවේ සෙසු සියලු සොයුරන්ට මෙන්ම මේ සඳහා ලිපි, ඡයාරූප, හා නිර්මාණ ඉදිරිපත් කළ සැමටත් මාගේ හෘදයාංගම කෘතවේදී ප්‍රණාමය පුදන්නට මෙය අවස්ථාවක් කර ගනිමි.

අවසාන වශයෙන් දැයට නිර්මාණශීලී නියමුවන් දායාද කරමින් තවත් චිරාත් කාලයක් දසත කිතුගොස රන්දමින් යෙහෙන් වැජඹෙන්නට උත්තරීතර වූ අනඳ මවුන් හට හැකිවේවායි පතමි. ඔබ සැමට ආනන්දයේ සරණයි!!!!

**පී.කේ.දීපාල්**

**ප්‍රධාන සංස්කාරක**


## OLCOTT ORARTION & NEWSLETTER SUBCOMMITTEE

***Sub Committee Chairman***
Asanga Priyadarshana

***Joint Secretaries***
Chamikara Amarasekara /
Amal Jeewandara

***Treasurer***
Chanaka Bandara

***Committee Members***
Nirmala Samarasinghe
Sunera Mahanamahewa
Anushka Millavitiya
Miyuru Dayarathna
Akalanka Liyanarachchi
Geeth Perera
Jayan Jayawickrama
Sanjeewa Premarathna
Niluka Rajapakse
Dampal Rodrigo
Janaka Namal
Lakshitha Abeyrathne
Thushan Wijesinghe
Samitha Peiris

## ANANDAYA NEWSLETTER 2023 (NOVEMBER EDITION) EDITORIAL COMMITTEE

***Chief Editor/Content Coordination/ Content Writing***
P.K.Deepal

***Assistant Editor/Content Writing***
Mahesh Rathnayake

***Design & Layout Coordination***
Tharindu Mallawaarachchi

***Photography***
Manjula Makolage

***Videography***
Sanjaya Bandara Senarath

***Content Writing/Coordination***
Theja Perera
Muditha Dayaratna
Chamara Kapuge
Pradeep Saranga
Savi Ganepola
Lasitha Muhandiram
Tharindu Samaraweera

# MANAGEMENT COMMITTEE OF THE ACOBA 2023/2024

**Prof. Athula Kaluarachchi** *Executive President*

**Mr. Bimal Wijayasinghe** *Immediate Past President*

**Mr. Samitha Senevirathne** *Deputy President*

**Mr. Dinuka Chandrakeerthi** *Joint Secretary*

**Mr. Yasas Randunu Ariyarathna** *Joint Secretary*

**Mr. Praveen Ruberu** *Treasurer*

**Mr. Anura Perera** - *Vice President*

**Mr. Asanga Priyadarshana -** *Vice President*

**Mr. Chaminda Egodawatta** - *Vice President*

**Mr. Mahendra Jayasinghe** – *Vice President*

**Mr. Shiran Perera** – *Vice President*

**Mr. Sujeewa Rathmahal** – *Vice President*

**Prof. Udeni Nawagamuwa** - *Vice President*

**Mr. Gamika Kodagoda** - *Asst. Secretary*

**Mr. Thilina Rathnayake** - *Asst. Secretary*

**Mr. Sujeewa Widanapathirana -** *Asst. Treasurer*




















# Pioneering Contributor to Ground Improvement and Transport Geotechnics,

Professor Buddhima Indraratna is a Distinguished Professor at the University of Technology Sydney (UTS), the highest echelon of the professorial status in Australia. He is recognized as a world leader in the field of Geo technical and Transportation Engineering and ranked among the 10 most cited in the world in this field.

Professor Indraratna completed his primary and secondary school studies until the GCE Ordinary Level at Ananda College, Colombo, before departing to the United Kingdom on a British Council Scholarship based on his excellent performance at the GCE O/L.



After completing his high school in the UK with excellent results at the International Baccalaureate examination (i.e., equivalent to GCE Advanced Level), he was selected to study Civil Engineering at the Imperial college of London (both bachelor's and master's degrees), and later completed his PhD in geo technical engineering at the University of Alberta, Canada.

In terms of industry employment, he had worked at the Kotmale Dam Project in Sri Lanka as a geo technical engineer for William Halcrow & Partners and CECB, and in eastern Canada as a geo technical engineer and ground control researcher for underground mining. Subsequently, he worked at the Asian Institute of Technology, Thailand as an Associate Professor before migrating to Australia to join the University of Wollongong in 1991.After 3 decades at University of Wollongong, Prof. Indraratna accepted the challenge of leading the Transport Research Centre at the University of Technology Sydney (UTS) as its Director in August 2020.

Professor Buddhima Indraratna has been nominated as the distinguished Anandian who will deliver the annual Olcott oration for this year. Professor Indraratna joined Dinuka Sumithraarachchi for a conversation ahead of his visit to Sri Lanka to deliver the Olcott oration this year to be held on the 25th of November.

**Dinuka -** I know you're joining amidst a very busy schedule, and we really appreciate you for taking the effort and the time to join us today, quite late in the hours for you as we understand which effort we truly appreciate. If I may ask you first to set the tone for our conversation what motivated you to accept this invitation that was extended to you?

**Prof. Indarathana -** First of all, I wish to thank the Old Boys Association of Ananda for extending this kind invitation, which is a great privilege and an honor. What motivated and excited me was knowing that I would get an ideal opportunity to convey a timely message, specially to the young professionals in Sri Lanka how early passions can drive your career paths based on your aspirations. I hope that I will be able to inspire many young professionals in the audience in November. They will be able to mimic certain aspects of my journey, and do even better; so, this is not just an opportunity for me to demonstrate what I have achieved but may also serve as a guide for younger professionals who are hoping to enhance their career paths.

**Dinuka-** Early school days are always very important in terms of getting the right foundation which plays a big part in how you manage yourself for the rest of your life. I'm very keen to understand, how did Ananda College influence your Professional as well as Personal life?

**Prof. Indarathana -** Indeed, that was the fundamental initial pathway. I mean from the time I was at Ananda from Grade 2 onwards, but mind you, I started Grade 1 at Royal College. I believe that was kind of an experimental effort by my Parents, because my elder brother was already at Ananda. After one year they decided that Ananda was a better place for both of us. So, I was then transferred to Ananda, and I can assure you from the days of my primary to the secondary high school, Ananda always had Principals of able leadership, and dedicated teachers to ensure very high-quality education particularly in Science and Mathematics subjects. The inspiration I drew from their brilliant teaching methods created an excellent learning environment through which I learnt to appreciate the importance of academic excellence, and to build on my passions from a very young age. I did very well in science subjects, and also excelled in Mathematics, and the subsequent successes could be partially or wholly attributed to the special skills of my teachers at Ananda.

I believe that upper high school is the place where you first think about your future and wonder where you want to be in 10 years' time. In my case it was in Grade 9 that I passionately started to think about a technological career, and partly because of the talented teachers in Mathematics and Sciences it was a relatively easy decision for me. Even before I went to England, I had already decided on an Engineering pathway, but of course, it was later after getting admission to Imperial College that I was able to branch out to Civil Engineering. In essence, Ananda College has always been perfect in creating that special academic environment for me, and also providing me the opportunities to hone my leadership skills and team spirit as a prefect, as well as being active in numerous social events and extra-curricular activities which encouraged interaction with others.


**Dinuka-** Ananda College has always produced some of the best Graduates as far as the stream of Mathematics is concerned, but a student who has scored 3 As with a good z score wouldn't necessarily translate themselves well into an excellent Engineer, and vice versa. What advice would you give to a student in transitioning himself from being an academic into being a strong Professional?

**Prof. Indarathana -** I think managing the transition phase is partly to do with one's understanding of the circumstances at the time in relation to what one's training and background, apart from one's career aspirations for the future. Of course, the monetary factor is always there, and if you are a person who really wants to earn a lot of dollars quickly, then it is better to consider business or commerce options rather than becoming an Academic For instance, one can become a professional engineer and form one's own consulting or contracting firm. There will always be different factors and challenges, so it is up to an individual to be creative and handle the opportunities as they arise. The most important thing is to realise that the performance in examinations even at the university level is not a guaranteed link to becoming a brilliant Engineer. One can end up getting a first class in Engineering and end up working in a Commercial Bank ten years down the line .I've known Engineers who are now working in the commerce sector after completing Business Management programs, because they had realised later in life that engineering was not ideally suited for them.

**Dinuka-** How important do you think your other engagements at school outside academics was a critical factor which helped you at a later point in life?

**Prof. Indarathana-** I think the Work-Life Balance is crucial from the time of your school days. One may not readily adopted his in the context of education in Sri Lankan schools given the significant pressures to perform exceedingly well to get admission to Universities, and the teachers themselves may not convey this message effectively to the students. I personally believe that children even at a young age should be engaged in some sports or other extra-curricular activities such as chess, music, drama or debating to create that balance, because the social interactions are important to make one an all rounder. I have seen people getting terribly frustrated and losing motivation when they don't achieve what they aspire for in a given task, and this can be attributed to not having a balanced lifestyle continued from a younger age. If one can balance one's academic work with leisure activities from the school days and take part in social activities, that is indeed what the inception of teamwork is all about. Even in our professional lives, teamwork evolves from social engagements and cultural interactions. In my case, I had that experience from the time I was a young kid through various activities at Ananda. This initial training extended to our later professional careers makes us equipped to handle stress and anxiety, and to understand the challenges better and appreciate the outcomes with a more open mind. These experiences cannot be learnt from a textbook, but they do culminate at the end to create an all-round person to be successful in a chosen professional career.

**Dinuka-** If you look back at your story, what are the things you did right and what helped you achieve what you have achieved today?



**Prof. Indarathana-**
My thoughts go back to my late Parents. They were my role models from the time I was very young and growing up with my elder brother and younger sister. My father was a professor of economics, and my mother was a medical doctor. How they advised us on practically everything including extra-curricular activities, and how they trained us to be disciplined from the beginning had a huge impact. For example, they would never let us miss the Sunday Dhamma School or the piano lessons from the time we were very young. I played Table Tennis for Ananda and was also in the athletic and swimming squads from my younger days until I left for England. I still believe that the kind of balanced engagements helped me to achieve one of the highest aggregates in the country at the GCE O/Ls in that particular year, and then to receive the British Council's prestigious Lord Mountbatten Scholarship to go to the UK for further studies.

For me the milestones were very focussed on when I left for England for further studies. I decided to do Civil Engineering because infrastructure always impressed me, and my goal was to study well and somehow get admission to Imperial College of Science and Technology in London. My next goal was to secure good industry opportunities, and I was lucky to get my very first job as a Junior Engineer at the Kotmale hydropower dam project under the joint consultants William Halcrow & Partners of UK and the CECB in Colombo. I enjoyed and learnt a lot from that job but realised that there were many technical aspects I had not learnt at the University level. So, some of the difficult challenges I had to face in the dam site forced me to use my common sense and my own judgement on various occasions. That is what motivated me to do research, so I collected data from the Kotmale project and went back to Imperial college to do a Msc degree in Soil Mechanics, and during this time I realised about my strong analytical skills for engineering solutions. I wanted to do something new in this field and decided to embark on a PhD program at the University of Alberta in Canada. After completing the PhD in Geo technical Engineering, I went back to industry, worked for one year in Ontario province in eastern Canada. Here I learnt a lot about Mining Engineering and practical applications of underground geo technical engineering.

Later I was offered an opportunity for my first academic job at the Asian Institute of Technology in Thailand. Most people would not leave Canada to go to Thailand, but I took that challenge because I thought working in a Southeast Asian country would give me a different challenge due to different ground conditions in different type of projects, and this is when I became very interested in Geo technical Engineering applications to transportation infrastructure, and the inception of my serious research career. After 3 years at AIT, I migrated to Australia at which time I had already decided to become an Academic for the long term, as by that time I have had sufficient research knowhow as well as industry experience.

I became successful very quickly and managed to form Australia's first research center focused on the problems of road embankments and railway tracks with special reference to ground improvement. At that time in early 1990s, Australia did not have proper institution for high-quality railway research, so I pioneered that area realizing that Australia needed this expertise. The Australian railways have improved a lot mainly because of three decades of my research and development outcomes that have been adopted by industry. Today several Universities work in this area following what I had started in Australia.

**Dinuka-** Before i let you go i think our audience would like to know a bit more about your personal life, we've discussed a lot about your professional life and the macro's, but what do you like to do during your off time?

**Prof. Indarathana-** Right now my wife's and my life seem to revolve around our one-year-old grandson; that's what all the weekends are about, as either we go to see him, or they come to our place. Apart from that I do have various hobbies. I watch a lot of cricket and in the summer I spend some time at the SCG -Sydney Cricket Grounds. I am also interested in music, and I play the piano and the keyboards whenever the time permits.

I also have a keen hobby in outdoor Koi fish. I am not sure whether you are familiar with Koi fish, and it is a very relaxing pastime. I have a large koi pond in my back garden, and they do become wonderful pets but requiring much care.

Taking time off for travelling overseas and around Australia with family is also important to me. Spending much of the weekends doing things which provide a much-needed break from the normal academic work at the University is important to ensure optimum concentration. If you keep working on academic tasks seven days per week, you may not even realise how rapidly your concentration can fall to affect productivity.

**Dinuka-** So Professor we'd like to take this moment to thank you for joining us, it was an absolute pleasure to have your here with us today, we totally appreciate you finding the time and effort for us, we hope to see you in Sri Lankan November and we know that we are in for a treat to be listening to you as our Olcott orator for 2023.

**Prof. Indarathana-** Thank you very much Dinuka. Once again please convey my kindest regards and gratitude to the OBA of Ananda for this invitation. It is an absolute honor and privilege for me to be the next Olcott orator, so I am looking forward to this event in November. I will be speaking about innovative concepts of transport infrastructure through real-life projects and solutions. Hopefully, some professionals in the audience can apply these concepts considering the circumstances in Sri Lanka prevailing at the moment. Thank you so much for this opportunity.



# එන්.ජී. පුංචිහේවා

## (ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති 2005-2007)

වර්ෂ 1947 ජුනි මස 30 දින ගාල්ල, අහංගම, වැල්හේන්ගොඩ නම් සුන්දර ග්‍රාමයේ උපත ලද නිව්ටන් ගාර්දිය පුංචිහේවාගේ පියාණන් ව්‍යාපාරිකයකු වූ අතර මෑණියන් ගෘහණියක වූවාය. සහෝදර සහෝදරියන් තිදෙනෙකුගෙන් යුත් පවුලක සමාජිකයෙකු වූ ඔහු ඉතා ළදරු අවධියේ ම පියා මෙලොවින් සමුගත් බව සඳහන් ය. මූලික අධ්‍යාපනය උපන් ගම වැල්හේන්ගොඩ ප්‍රාථමික විද්‍යාලයෙන් සහ අනතුරුව කතළුව මධ්‍ය විද්‍යාලයෙන් හැදෑරූ ඔහු උසස් අධ්‍යාපනය සඳහා 1961 දී ආනන්ද විද්‍යාලයට ඇතුළත් විය.

ආනන්ද විද්‍යාලයෙන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහ අ.පො.ස. (උසස් පෙළ) පරීක්ෂණයන් ඉහළින් සමත් වූ ඔහු 1965 වසරේ දී ලංකා විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබීය.

ශිෂ්‍යයෙකු ලෙස ආනන්දයේ ගත කල කාලය තුල විවිධ ශිෂ්‍ය ක්‍රියාකාරකම් හි නිරත වූ අතර  ආනන්දයෙන් ජාති හිතෛෂීත්වය සහ නායකත්වය සඳහා ඉටු කරන ලද සේවය පිළිබඳ මනා අවබෝධයක් සහ ඒ සඳහා ඇවැසි හුරුව ලබාගත් බව ඔහු පසුකාලීනව ලියන ලද ලිපි සහ දරන ලද තනතුරු වලදී ක්‍රියාකරන ලද ජාතිමාමක ආකල්පය සාක්ෂි දරයි.

1969 වර්ෂයේ දී ලංකා විශ්ව විද්‍යාලයෙන් භූගෝල විද්‍යාව පිළිබඳ විශේෂ ගෞරව උපාධිය ඔහු සමත් වූයේ පන්ති සමාර්ථයක් ද සමගිනි. ඔහු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳව සහ ඔස්ට්‍රේලියාවේ ඇඩිලේඩ් ෆ්ලින්ඩර්ස් සරසවියේ සමාජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාධරියෙකු ද විය.

මූලික උපාධිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව 1969 වසරේ දී ම ශ්‍රී ලංකා මහ බැංකුවේ ලිපිකරුවෙකු ලෙස සිය රාජකාරී දිවිය ඇරඹූ ඔහු වසර 35කට අධික රාජ්‍ය සේවා රාජකාරී කාලය තුල ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පැසසුම් ලත් නිලධාරියෙකු ලෙස නියෝජ්‍ය කොමසාරිස් අලෙවි සංවර්ධන දෙපාර්තමේනතුව, නියෝජ්‍ය ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය, නියෝජ්‍ය ලේකම් තරුණ කටයුතු සහ සේවා නියුක්ති අමාත්‍යංශය, අධ්‍යක්ෂ ජාතික තරුණ සේවා සභාව, ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය ලේකම් ප්‍රාදේශිය සංවර්ධන අමාත්‍යංශය සහ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යංශය, අතිරේක ලේකම් සමෘද්ධි අමාත්‍යංශය යන තනතුරු හොබවමින් දකෂ අවංක සහ කෘතහස්ත සේවයක් ඉටුකරන ලදී. 2004 වසරේ දී විශ්‍රාම යන අවස්ථාව වන විට ඔහු තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යංශයේ ස්ථිර ලේකම්වරයා ලෙස සේවයෙහි නියුක්තව සිටියේය.



ඔහුගේ රාජ්‍ය සේවා කාලය තුල ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඔහු සහභාගී වූ ජාතික සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, සම්මේලන, වැඩසටහන් සහ වැඩමුළු අතිමහත්ය. ඒ අතුරින් 1983 ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳව හයිද්‍රාබාද් සමුළුව, 1992 තායිලන්තයේ පැවති තරුණ කටයුතු සහ පරිසරය පිළිබඳ අන්තර් ජාතික සමුළුව, 1991 ශ්‍රී ලංකාවේ පැවති දකුණු ආසියානු ක්‍රීඩා තරඟ මුදල් අනුකම්ටුව, 1996 ලෝක ක්‍රීඩා කොන්ග්‍රසය නව දිල්ලිය, 2000 සිඩ්නි පැවති ඔලිම්පික් ක්‍රීඩා සඳහන් කල හැකිය.

**ඔහුගේ රාජ්‍ය සේවා කාලය තුල ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඔහු සහභාගී වූ ජාතික සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, සම්මේලන, වැඩසටහන් සහ වැඩමුළු අතිමහත්ය. ඒ අතුරින් 1983 ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳව හයිද්‍රාබාද් සමුළුව, 1992 තායිලන්තයේ පැවති තරුණ කටයුතු සහ පරිසරය පිළිබඳ අන්තර් ජාතික සමුළුව, 1991 ශ්‍රී ලංකාවේ පැවති දකුණු ආසියානු ක්‍රීඩා තරඟ මුදල් අනුකම්ටුව, 1996 ලෝක ක්‍රීඩා කොන්ග්‍රසය නව දිල්ලිය, 2000 සිඩ්නි පැවති ඔලිම්පික් ක්‍රීඩා සඳහන් කල හැකිය.**

අජන්ති ජයසූරිය මෙනවිය සමඟ අතිනත ගත් නිව්ටන් පුංචිහේවා ජ්‍යේෂ්‍ඨ සහ කනිෂ්ඨ පුතුන් දෙදෙනාගේ දයාබර පියාණන් විය. අජන්ති පුංචිහේවා මහත්මිය 1986 සිට 1999 දක්වා ආනන්ද විද්‍යාලයේ බටහිර සංගීතය පිළිබඳ ගුරුතුමිය ලෙස සේවය කල අතර බටහිර තූර්ය වාදක කාණ්ඩායම භාර ආචාර්යවරිය ලෙස මහගු සේවයක් ඉටුකලාය. පුතුන් දෙදෙනා ද ආනන්දයේ අධ්‍යාපනය ලබා වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කොට උසස් රැකියා වල නිරතව සිටී.

ස්වකීය රාජකාරී සහ පෞද්ගලික කටයුතු වල කොතරම් කාර්යයබහුල ජීවිතයක් ගතකල ද ඔහු ආනන්ද විද්‍යාලය සමග පැවති සබඳතා කිසිවිටකත් අමතක නොකලේ ආනන්ද විද්‍යාලීය ආදි ශිෂ්‍ය සංගමයේ කටයුතු වලට නිරන්තරයෙන් ම ස්වකීය දායකත්වය අවැසි අයුරින් ලබා දෙමිනි. 1980 දශකයේ සිටම ආදි ශිෂ්‍ය සංගමයේ



විධායක සභිකයෙකු ලෙස ද 1994 සිට 1997 දක්වා එහි සමලේකම්වරයෙකු ලෙස ද කටයුතු කරන ලදී. අනතුරුව උප සභාපතිවරයෙකු ලෙස වසර කීපයක් ද නියෝජ්‍ය සභාපතිවරයා ලෙස වසර දෙකක් ද තනතුරු හෙබවීය.

2005 - 2007 වසර සඳහා නිව්ටන් ගාර්දිය පුංචිහේවා ආනන්ද විද්‍යාලීය ආදි ශිෂ්‍ය සංගමය නම් වූ සම්මානනීය සංවිධානයේ සභාපති ධූරය සඳහා සාමාජිකත්වය විසින් තෝරා පත්කරගන්නා ලදී.

ආනන්ද විද්‍යාලයේ යුග මෙහෙවර පිළිබඳව ආනන්දයට ආනන්දය ගෙනා වියතුන් රැසකගේ තෝරාගත් ලිපි ලේඛන, "ආනන්දයේ මතක සටහන්" නමින් වටිනා ග්‍රන්ථයක් ජේ. එෆ්. රංජිත් පෙරේරා සමඟ එන්. පී. පුංචිහේවා විසින් සංස්කරණය කර ප්‍රකාශයට පත් කරන ලදී.

එසේ ම ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයට සියක් වසරක් පිරෙන අවස්ථාවේ 2008 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලද සමරු කළාපයට "ආනන්ද විද්‍යාලයේ අයිතිකරුවෝ කවුරුන්ද?" යන මැයෙන් ලිපියක් සපයන ඔහු මෙසේ සඳහන් කරයි.

උපුටා ගැනීම.

"ආනන්දය වසර 122ක් පැරණි මෙම මහා වෘක්ෂය තවත් වර්ෂ සිය ගණනක් ඉදිරියට මෙම සරු පොළොවෙහි පෝෂණය වෙමින් එල දැරීමට අවස්ථාව ලබා දෙමින් එම මං පෙතෙහි ඉදිරියට පැමිණෙන බාධක මග හරවමින් මුළු රටට ම පොදුවේ සේවය කිරීමට පරිසරය සකස් කිරීම, එම කාර්යෙහි ලා වර්ෂ 100ක අත්දැකීම් ඇති ආදි ශිෂ්‍ය සංගමයට පැවරී ඇති දැවැන්ත කාර්යයි. එම කාර්යය ඉටු කිරීමේ දී අප විද්‍යාලය මෙතෙක් ආ මඟ නිරතුරුව ම සිහියේ තබා ගනිමින් මෙම දැවැන්ත වෘක්ෂයේ පෝෂක මූලාශ්‍රය අමතක නොකරමින්, වෙනස් වන සමාජ පරිසරයෙන් එල්ල වන අභියෝග ජය ගැනීමට, අප විදුහලේ උන්නතියට අතහිත දෙන සියළු බලවේග වලට නායකත්වය දෙමින් ඉදිරි පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ. එසේ නොමැතිව මෙම මහා වෘක්ෂය කෘතිම ආවරණයක බහාලු 'දර්ශනීය., 'ආකර්ශනීය. කෘතිම ප්ලාස්ටික් ගසක් බවට පත් නොකල යුතුය. "

ආනන්දය සම්බන්ධයෙන් ආනන්ද ආදි ශිෂ්‍ය සංගමයේ කාර්යයභාරය කෙසේ විය යුතු ද යන්න පිළිබඳ ඔහුගේ දර්ශනය ඉහත ප්‍රකාශයෙන් මනාව පිළිඹිඹු වේ.

ජ්‍යේෂ්ඨ ආදි ආනන්දීය සංවිධානයේ සභාපතිවරයා ලෙස ද වසර දෙකක් කටයුතු කල එතුමා ජ්‍යේෂ්ඨ ආදී ආනන්දීයන්ගේ ආගමික හා සංචාර කටයුතු සංවිධානය කිරීම වෙනුවෙන් වැදගත් මෙහෙවරක් ඉටුකරන ලදී.

එතුමාගේ අනෙකුත් ආගමික හා සමාජීය කටයුතු අතර සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ජාතික සංවර්ධන මණ්ඩලයේ උපසභාපති ධූරය දරමින් සම්මේලනයට පරිත්‍යාග ලෙස ලැබී තිබුණ ඉඩකඩම් රාශියක් නිරවුල් කර ගැනීමට කටයුතු කල අතර අනතුරුව කෘත්‍යාධිකාරී මණ්ඩලයේ උපසභාපති ධූරය හොබවමින් ජාතික තරුණ මණ්ඩලයේ සභාපති ලෙස ද වැදගත් වැඩකොටසක් ඉටු කරන ලදී.

තම උපන් ගම් ප්‍රදේශයේ ස්වකීය ඥාතීන් එක්ව 1943 දී පිහිටුවන ලද "කතළුවේ ගාර්දිය පුංචිහේවා ඥාති සමාජයට" සම්බන්ධව එම සංවිධානයේ විධායක සභිකයෙකු, ලේකම්වරයෙකු ලෙස ඥාතීන් අතර එකමුතුකම, සමඟිය, සහජීවනය වර්ධනය කිරීමේ කටයුත්තට මහගු දායකත්වයක් ලබා දෙන ලදී.

දේශයටත්, ආනන්දයටත් අවංක නිකැළල් ආදර්ශවත් නිහඬ සේවයක් ඉටුකරමින් නිදහස් විශ්‍රාමික ජිවිතයක් ගත කරමින් සිටි, අප ආදරණීය සහෘදයා, නිව්ටන් පුංචිහේවා 2021 මාර්තු 06 දින සදහටම දැයෙන් සමුගත්තේ ඔහු ඇසුරුකල කාගෙත් නෙතට කඳුලක් එක් කරමිනි.

**සටහන**
**ලලිත් සේනානායක - හිටපු සභාපති**

**"ආනන්දය වසර 122ක් පැරණි මෙම මහා වෘක්ෂය තවත් වර්ෂ සිය ගණනක් ඉදිරියට මෙම සරු පොළොවෙහි පෝෂණය වෙමින් එල දැරීමට අවස්ථාව ලබා දෙමින් එම මං පෙතෙහි ඉදිරියට පැමිණෙන බාධක මග හරවමින් මුළු රටට ම පොදුවේ සේවය කිරීමට පරිසරය සකස් කිරීම, එම කාර්යෙහි ලා වර්ෂ 100ක අත්දැකීම් ඇති ආදි ශිෂ්‍ය සංගමයට පැවරී ඇති දැවැන්ත කාර්යයි. එම කාර්යය ඉටු කිරීමේ දී අප විද්‍යාලය මෙතෙක් ආ මඟ නිරතුරුව ම සිහියේ තබා ගනිමින් මෙම දැවැන්ත වෘක්ෂයේ පෝෂක මූලාශ්‍රය අමතක නොකරමින්, වෙනස් වන සමාජ පරිසරයෙන් එල්ල වන අභියෝග ජය ගැනීමට, අප විදුහලේ උන්නතියට අතහිත දෙන සියළු බලවේග වලට නායකත්වය දෙමින් ඉදිරි පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ. එසේ නොමැතිව මෙම මහා වෘක්ෂය කෘතිම ආවරණයක බහාලු 'දර්ශනීය., 'ආකර්ශනීය. කෘතිම ප්ලාස්ටික් ගසක් බවට පත් නොකල යුතුය. "**

# SCHOOL ACTIVITIES

## Annual Prize Giving - 2022







## Cagers Carnival By Ananda Basketball

A mesmerising day full of basketball and more successfully got underway @ HSC Blues basketball courts on 29th of October 2023.












## PILIBIMBU 2023








## P.D.S. Kularathne Shield AC Vs NC Rugby Encounter







## ආනන්ද වෛශාඛ්‍ය මංගල්‍යය







## The Colors Nite - 2022












## Primary Broadcasting Unit Opening Ceremony







# 86 වසක් පුරා බසෙහි රස හඳුනන අනඳ පුතුන්ගේ නිර්මාණශීලී හැකියාවන් ඔප කළ "සිංහල සාහිත්‍ය සංගමය"

වසර 137 ක අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන ජාතියෙ මහා හෙළ බොදු තක්සලාව වන ආනන්ද විදුහලේ ලේඛන කලාවට හිතැති, කවියට පෙම්බැඳි, සාහිත්‍යයට ලැදි සිසුන් පිරිසක් ඒකරාශී කොට ගෙන වර්ෂ 1937 දී එවකට විදුහලේ සිප්සතර හැදෑරූ සිසුවෙකු වූ ද, පසුකලෙක කොළඹ යුගයේ දෙවන කවි පරපුර නියෝජනය කළ සුදීප්තිමත් කවියකු මෙන්ම "සිළුමිණ" හා "සරසවිය" ආදී පුවත්පත් වල ප්‍රධාන කතෘවරයෙකු වූ ද, මීමන ප්‍රේමතිලකයන්ගේ සභාපතීත්වයෙන් ඇරඹි "ආනන්ද විද්‍යාලයීය සිංහල සාහිත්‍ය සංගමය" ජාතියට නායකත්වය දුන් දේශපාලනඥයන්, කෘතහස්ත සාහිත්‍යධරයන්, කීර්තිමත් සරසවි ආචාර්ය, මහාචාර්යවරුන් ආදී විවිධ ක්ෂේත්‍ර නියෝජනය කළ විද්වතුන් රාශියකටම දෙසබස රැස සුරකීම උදෙසා කැපවීමට මඟ පෙන්වූ සංගමයක් විය. ඒ ඇසුරේ හැදී වැඩුණු බොහෝ දෙනා නම කියූ පමණින් රටක් හඳුනන කීර්තිමත් පුද්ගලයින් වූහ.

මේ අතර නිසදැස් කාව්‍ය ආකෘතිය ලාංකීය සාහිත්‍යයට හඳුන්වාදුන ජී.බී.සේනානායක වැනි ගත් කතුවරුන්, පණ්ඩිත විමල් අභයසුන්දර වැනි කිවිවරුන්, මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර ද මැල් වැනි ජනසන්නිවේදන විෂයේ පුරෝගාමීන්, මහාචාර්ය ජේ.බී. දිසානායකයන් වැනි භාෂා විද්වතුන්, මහාචාර්ය ප්‍රනීත් අභයසුන්දර, මහාචාර්ය දයා අමරසේකර වැනි සමාජවිද්‍යා ආචාර්යවරුන්, මහාචාර්ය සුදර්ශන සෙනෙවිරත්න වැනි පුරාවිද්‍යාඥයන්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු යසන්ත කෝදාගොඩ, ජනාධිපති නීතිඥ යූ.ආර්.ද සිල්වා, ජනාධිපති නීතිඥ ප්‍රසන්ත ලාල් ද අල්විස් වැනි නීති ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්, ඉම්තියාස් බාකීර් මාකර්, රංජිත් අමරකීර්ති පලිහපිටිය වැනි දේශපාලනඥයන්, ඩී.බී.නිහාල්සිංහ වැනි අසහාය සිනමාවේදීන්, දයානන්ද ගුණවර්ධන, විජේරත්න වරකාගොඩ වැනි නාට්‍යවේදීන්, ඒ.ඩී.රංජිත් කුමාර, බන්දුල පද්මකුමාර, සුනිල් මාධව ප්‍රේමතිලක, සිසිර පරණතන්ත්‍රි, අනුර බංඩාර රාජගුරු, ආචාර්ය නුවන් නයනජිත් කුමාර, අරුණ ගුණරත්න, ශාන් විජේතුංග වැනි පුවත්පත් කතුවරුන්, නාලක ගුණවර්ධන, දිනේෂ් කොළඹගේ, මහාචාර්ය නිමල් හෙට්ටිආරච්චි, වැනි ලේඛකයන්, ඩෝල්ටන් අල්විස්, ජෝර්ජ් ලෙස්ලි රණසිංහ, ප්‍රේමකීර්ති ද අල්විස්, බණ්ඩාර කේ. විජේතුංග, කුලරත්න ආරියවංශ වැනි ගී පද රචකයන්, එච්.එම්.ගුණසේකර, නිමල් ලක්ෂපතිආරච්චි, චන්දන තිලකරත්න, ආචාර්ය රංග කලංසූරිය, කිංස්ලි රත්නායක, මොහාන් රාජ් මඩවල, සරත් ජයසිංහ, තේජ පෙරේරා, ශෂික ජයතිලක, රොෂාන් වටවල වැනි මාධ්‍යවේදීන්, රවිනාථ ආරියසිංහ වැනි රාජ තාන්ත්‍රිකයන්, මහාචාර්ය සම්පත් අමරතුංග, මහාචාර්ය හිරාන් අමරසේකර වැනි සරසවි ආචාර්යවරුන්, තම තමන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාලව පොත පත ද රචනා කරමින් භාෂා චාතූර්යයෙන් හෙබි දක්ෂ









**විද්‍යාලයීය සාහිත්‍ය සංගමය හා ඊට සමගාමීව කාලීනව ක්‍රියාත්මක වූ "නිර්මාණශීලී ලේඛක කවය" සහ "තරුණ ලේඛකයින්ගේ සංගමය" යන සංගම් දෙකෙහි නිලධාරීන් හා සාමාජිකයින් එක්ව පසුගිය දා "ආදී ආනන්දීය සිංහල සාහිත්‍ය සංගමය" නමින් සංගමයක් පිහිටුවා ගත් අතර, එය විද්‍යාලයීය ආදි ශිෂ්‍ය මව් සංගමයේ ද අනුබද්ධ සංවිධානයක් ලෙස ලියාපදිංචිව වත්මන් සාහිත්‍ය සංගමයට මනා දිරියක් ලබා දෙමින් සිටී.**



කතිකයින් බවට පත්වුයේ තම පාසල් වියේ දී සිංහල සාහිත්‍ය සංගමයේ ඇසුර ලබමින් වීම විශේෂත්වයකි.

එපමණකුදු නොව විශාරද ජගත් වික්‍රමසිංහ, විශාරද දර්ශන වික්‍රමතුංග, කසුන් කල්හාර ජයවර්ධන, කලිඳු වීරසිංහ, මිත්‍ර කපුගේ, ඉසුරු ජයරත්න, භානුක මනෝරත්න, ජනනාත් වරකාගොඩ, සහන් රන්වල, ගාමින්ද ප්‍රියවිරාජ්, විදර්ශන කන්නන්ගර, අසංක සායක්කාර, ඉන්ද්‍රචාපා ලියනගේ, හසලක තුෂාර, චරිත දිසානායක, කුරුළු කාරියකරවන ආදී කලාවට සබැඳි බොහෝ දෙනෙකුගේ ද පාසල් වියේ තිඹිරිගෙය වූයේ සිංහල සාහිත්‍ය සංගමයයි.

මෑත කාලයේ දී මහින්දසිරි පෙරේරා, ඩබ්.ඒ.එස්.රත්නායක, සෝමා සූරියආරච්චි, එච්.ඩබ්. දසනායක, සරත් චන්ද්‍රසිරි , ඉන්ද්‍රා අමරසිංහ, සුනන්දා ගුණතිලක, මාලිනී ඒ. විතානගේ ආදී ගුරු මව්පියවරු සංගමයේ භාර ආචාර්යවරුන් ලෙස සුවිසෙස් මෙහෙවරක් කළ අතර පූජ්‍යපාද අතපත්තුකන්දේ ආනන්ද නාහිමි සහ පූජ්‍යපාද අකුරැටියේ විමලවංශ හිමි ආදී ධර්මාචාර්ය හිමිවරුන් අනුශාසකත්වයෙන් මග පෙන්වූහ.

විද්‍යාලයීය හා විද්‍යාලාන්තර සාහිත්‍ය තරඟමාලා සංවිධානය කරමින් ඒවායෙහි ජයග්‍රාහකයින් අගයා සහතික හා ත්‍යාග ප්‍රදානය කිරීම වෙනුවෙන් වාර්ෂිකව "කලා උළෙල" සංවිධානය කළ ආනන්දීයන් එය ජාතික උත්සවයක් තරමටම උසස් ලෙස පවත්වන්නට සමත්වූහ. පසු කලෙක එය "අනඳ පැහැසරණිය" නමින් නම් වු අතර, 2023 මාර්තු මස දී 10 වන අනඳ පැහැසරණිය පවත්වන්නට යෙදුනේ සංගමයේ 85 වන සංවත්සරයට සමගාමීවය.

විද්‍යාලයීය සාහිත්‍ය සංගමය හා ඊට සමගාමීව කාලීනව ක්‍රියාත්මක වූ "නිර්මාණශීලී ලේඛක කවය" සහ "තරුණ ලේඛකයින්ගේ සංගමය" යන සංගම් දෙකෙහි නිලධාරීන් හා සාමාජිකයින් එක්ව පසුගිය දා "ආදී ආනන්දීය සිංහල සාහිත්‍ය සංගමය" නමින් සංගමයක් පිහිටුවා ගත් අතර, එය විද්‍යාලයීය ආදි ශිෂ්‍ය මව් සංගමයේද අනුබද්ධ සංවිධානයක් ලෙස ලියාපදිංචිව වත්මන් සාහිත්‍ය සංගමයට මනා දිරියක් ලබා දෙමින් සිටී.

සිංහල සාහිත්‍ය සංගමය මගින් "කිතුගොස" නමින් නිර්මාණාත්මක සඟරාවක් පසුගියදා එළිදැක්වූ අතර, ඒ සඳහා ප්‍රාථමික අංශයේ "අකුරු මිතුරු" කණිෂ්ඨ ද්විතියික අංශයේ "ස්පර්ශ" හා උසස් පෙළ අංශයේ "බිහිදොර" නමින් ක්‍රියාත්මක බිත්ති පුවත්පත් වල වසර පුරා පළ වූ සිසු නිර්මාණ එක්කොට ගන්නා ලදී.

වත්මන් සිංහල සාහිත්‍ය සංගමය පූජ්‍යපාද ඕනෑගම උපාලි නාහිමිපාණන් වහන්සේගේ අනුශාසකත්වයෙන් , සේනා වසන්ත සේනා ගුරු මෑණියන් ප්‍රධාන භාර ආචාර්ය මණ්ඩලයේ මග පෙන්වීමෙන් චතුක ජයතිලක පුතණුවන්ගේ සභාපතීත්වයෙන් යුතු නිලධාරී මණ්ඩලයක මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වන අතර, දිවයින පුරා පාසැල් ගණනාවක පැවති සාහිත්‍ය තරඟාවලී රාශියකම සමස්ත ශූරතාවය දිනාගැනීමට ද, විශ්ව විද්‍යාල සහ ජාතික මට්ටමේ ජයග්‍රහණ රැසක් අප විදුහල වෙත ලබාගැනීමට ද සමත්ව තිබීම පැසසුම් කටයුතුය.

අනඳ කිතුගොස පතුරා, නැසී යන බස රැකගෙන ඉදිරියට යාමට ඔවුනට ශක්තිය හා දිරිය ලැබේවා යි අපි සුභ සිතින් ප්‍රාර්ථනා කරමු.

**ආදි ආනන්දීය**

**ඩෙන්සිල් ඉන්දජිත් පෙරේරා**



ACOBA ACTIVITIES

















## ACOBA Welfare, Affiliated Groups, Media & Publicity Subcommittee 2023

### Nurturing Connections and Initiatives

The ACOBA Welfare, Affiliated Groups, Media & Publicity Subcommittee has been hard at work throughout 2023, orchestrating events and initiatives that strengthen the bonds within the ACOBA community.

### EXCO Annual Get-Together: A Day of Celebration

The Annual Get-Together of ACOBA EXCO held on June 23rd, 2023, at Dutch Trails, Negombo, was a resounding success. The event was marked by its grand scale and featured a myriad of fun-filled activities that brought together distinguished old Anandians. It served as a day of camaraderie, laughter, and the creation of lasting memories. The subcommittee's commitment to creating an enjoyable and inclusive atmosphere was evident, making this gathering a memorable experience for all.

### Affiliated Groups' Meeting: Dialogue and Collaboration

On August 25th, 2023, the subcommittee organized an evening function followed by dinner at Solis Hotel, Pitakotte, bringing together the office-bearers of affiliated groups of ACOBA. The meeting aimed to establish an open forum for discussing concerns, sharing suggestions, and communicating the future project plans of ACOBA. This event played a pivotal role in fostering open communication and strengthening the collaborative spirit within the ACOBA community.

### Exclusive Benefit Schemes: Tailored Benefits for a Dynamic Community

The Welfare & Affiliated Groups Subcommittee has been at the forefront of introducing exclusive benefit schemes for ACOBA membership holders. This unique initiative, introduced two years ago, showcases ACOBA's commitment to providing unparalleled advantages to its members. It represents a forward-thinking approach that distinguishes ACOBA as a trailblazer among old boys' and girls' associations in Sri Lanka.

It is evident that these efforts have significantly contributed to the unity, progress, and well-being of our beloved association.

In conclusion, let's stay connected, stay engaged, and continue building a stronger ACOBA community together.

## "UTHURIN NAGAM 2023"




It's that time of the year. Schools celebrate brotherly love at the grounds as big match fever is upon us. Among those gems of sports celebrations we come across a Diamond. A Diamond that stands out for its value and pristine nature. That is the Annual sports festival between the Jaffna Hindu College and Ananda CollegeColombo, themed as **"UTHURIN NAGAM 2023".**

This prestigious event started in 2012 coinciding with the 125th anniversary of Ananda College. This momentous event was held to relive the memory of Mr. V.T.S.Sivagurunathan a past pupil of Jaffna Hindu College and a beloved teacher of Ananda College. By then this festival consisted of Cricket match for Sivagurunathan Memorial Trophy, English debate for the Panikkar-Thanabalasingham Challenge Shield, Basketball and Chess tounements.



This sports festival between two outstanding schools among the Buddhist and Hindu communities have sent out a very clear and resounding message to the whole country. A message of brotherly love and respect that spreads among the many generations.

With time this Diamond of an event has become a fully fledged sports celebration as extended day event stretching up to several days. The venue alternates between Jaffna and Colombo. This year Ananda College hosted the festival in Colombo themed as **"UTHURIN NAGAM 2023"** which was held from 21st to 24th March 2023.







## SICAS at ANANDA

"**Arjuna- Babar -T20 Cup, 2023**"

"Arjuna- Babar -T20 Cup, 2023"between Salamat International Center for Advanced Studies Lahore Pakistan, and Ananda College Colomb Sri Lanka is yet again the newest addition of sporting culture established between two energetic competitors for the mutual betterment of school sporting arena with a touch of international competition standards. The inaugural encounter of this annual sporting event was held in Colombo as a fruitful result produced by the effortof the sports development subcommittee of Ananda College Old Boys Association (ACOBA) who took the initiative in to act on behalf of the Ananda College and the Old Anandaians Sports Club which is an affiliated group of the ACOBA with the collaboration of SICAS and representatives of Pakistan High Commission in Sri Lanka.

**SICAS….**

"SICAS" or "Salamat International Center for Advanced Studies" is one of Lahore's oldest and most prestigious network of schools that offers a comprehensive educational experience from pre-school to A' Levels. With a history dating back to 1974, SICAS schools today continue their commitment to unite knowledge and social responsibility. The schools seek students who combine academic aptitude, intellectual curiosity, and tenacity of character. Because learning and growth at SICAS arise from each individual's engagement with others, the richness of education at SICAS requires diversity, tolerance, as well as an awareness of the community they share.

SICAS team was managed and coordinated by Mr. MahamoodKashif, Mr. Nawaz Asim who were representatives of SICAS, and were comprised of extremely talented and competitive sportsmen who excelled in showcasing their skills at this inaugural sporting arena.








**Continued to page No. 19**

# ආනන්ද මාතාව බිහිකළ ප්‍රථම ගුවන් හමුදාපති

## එයාර් මාර්ෂල් උදේනි රාජපක්ෂ

**1886** දී ඇරඹුණු පරණවාඩියේ හෙළ බොදු තක්සලාවට වසර **137**ක් සැපිරී අවසන්. දේශයේ අභිමානය සුරකිමින් තවත් සියවස් ගණනාවකට ජාතියේ සිත් සතන් පුබුදුවාලන්නට ආනන්ද මාතාවට දීර්ඝායු ප්‍රාර්ථනා කරමින් "ආනන්දය" සඟරාව හා සංවාදයට එක්වන්නේ අපේම කීර්තිධර ආදි ආනන්දීයෙක්. වර්ෂ **1969** දී ගම්පහ සියනෑවේ උපත ලද ජාතියටත් දේශයටත් අග්‍රගණ්‍ය සේවාවක නිරත වන ඔහු ආනන්ද මාතාව බිහිකළ ප්‍රථම ගුවන් හමුදාපති වරයායි. ආදි ආනන්දීය, වර්තමාන ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් උදේනි රාජපක්ෂ මැතිතුමනි ආයුබෝවන්....

ආයුබෝවන්...

ප්‍ර - අපි පලමුවෙන්ම ඔබේ ළමා කාලයෙන් කතාව පටන් ගනිමු

මගේ ළමා කාලය ගැන කතා කරන කොට මගේ ජීවිතයේ වීරයා තමයි මගේ පියා, සෝමතිලක රාජපක්ෂ මහතා. තාත්තා ටිකක් වසයි. හැබැයි මගේ අම්මා මගේ ළඟින්ම ඉඳගෙන අර තුලාවක් සමතුලිත කරනවා වගේ මා එක්කම හිටියා. පුංචි කාලෙ ගැන කතා කරද්දී මට අමතක කරන්න බෑ මගේ අයියයි නංගීයි. ඒ අතරින් මගේ අයියා ගැන කතා නොකරම බෑ. ආනන්දෙදි මම විෂය බාහිර වැඩ ගොඩක් කරපු හින්දා අධ්‍යාපනික වැඩ මගෙන් අතපසු වෙච්ච තැන් තිබුනා. මගේ අයියට පාඩම් කරන්න නැතත් එයා මගේ ළඟටම වෙලා හිටිය මම පාඩම් කරලා ඉවරවෙනකම්. මට තිබුනේ ඉතාම ආදරෙන් ඉතාම සහයෝගයෙන් ගෙවුණු ළමා කාලයක්. ඇත්තටම ඒ ගැන මම ගොඩක් ආඩම්බර වෙනවා



ප්‍ර - ඔබතුමන් **1985** ජුනි **6** වෙනිදා ආනන්දෙට ඇවිල්ල ක්‍රීඩා සමිති සමාගම් ඇතුළු බාහිර වැඩ රැසක් කරනවා ඒ කාලේ ආනන්දය ඔබ දැක්කේ කොහොමද?

ඔවු මම බණ්ඩාරවත්ත පරාක්‍රම විද්‍යාලයෙන් අධ්‍යාපනය ආරම්භ කරලා ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයට ගිහින් ඊට පස්සේ මගේ ජීවිතේට පන්නරය ලබාගන්නේ ආනන්ද විද්‍යාලයෙන්. සාමාන්‍ය පෙළ විශිෂ්ට ප්‍රතිඵල එක්ක ආනන්දෙට ආවහම මට හමුවුණු වීරයා තමයි සෙන්පති වි.එස්.කුඩලිගම මැතිතුමා. එතුමා එදා අපිට දුන් නායකත්වය අපිට පෙන්වූ නිර්භීතකම තමා අපිව අද දක්වා අරගෙන ඇවිල්ල තියෙන්නේ. මම ගුවන් හමුදාපති උනහමත් මම එතුමාට කතා කළා. එතුමා අඳින පළඳින විදිහ කතා කරන විදිහ කතාවේ ඇති හරය බොහෝ දේ අපිට කියලා දුන්නා. ඒ වගේම ගලප්පත්ති සර්, ඩි.ඩබ්ලිව්.දංගල්ල සර්, ප්‍රේමදාස ජයසිංහ සර්, උපුල් සුලෝචන සර්, වි.ඩි.එච්.ආරියදාස සර් වගේ තව ගොඩක් ගුරුවරු හිටියා. මම දැඩිව විශ්වාස කරනවා ඒ අය හින්දා තමයි අද මම මෙතන ඉන්නේ කියලා.

ප්‍ර - ශිෂ්‍යභට කණ්ඩායම වගේම ආනන්දයේ ක්‍රීඩා රැසක් නියෝජනය කළ කෙනෙක් ඔබ, ඒ කාලේ සමකාලීනයන් හා ක්‍රීඩාව ගැන ඔබේ මතකය අවදි කලොත්.,

සමකාලීනයන් ගැන කතා කලොත් මට නම් එකක් දෙකක් කියල නවත්තන්න අමාරුයි. 85, 86, 87, 88, මේ සියලු කණ්ඩායම් මාත් එක්ක එකට හිටියා. මම ගම්පහ ඉහළගම ග්‍රාමයේ ඉඳල දාරළුව ස්ටේෂන් එකෙන් කොළඹටම එන්න වාර ප්‍රවේශ පත්‍රය තිබුනත් මම ගම්පහට කෝච්චියේ ඇවිල්ල එතන ඉඳන් පාසල් බස් එකේ තමා ඉස්කෝලේ ආවේ. මොකද ඒ බස් එකේ මගේ යාලුවෝ ගොඩක් හිටියා. ඒ වගේ සොඳුරු කාලයක් නම් ආයි එන්නේ නෑ. කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨයට ඇතුල්වෙන්න ගිය දෙවන සම්මුඛ පරීක්ෂණයේදී මගේ චරිත සහතිකය බලලා ඇහුවා ඔයත් එක්ක තව කවුද හොස්ටල් එකේ හිටියේ කියලා. මම නෑ මම හොස්ටල් හිටියෙ නෑ කිව්වහම මගෙන් ඇහුවා, හොස්ටල් ඉන්නේ නැතුව කොහොමද මෙච්චර දේවල් කලේ කියලා. මම හැමෝම එක්ක හිටියා. අපි එවකදී ශිෂ්‍යභට තූර්ය වාදක කණ්ඩායම අංක 1ට තේරුනේ නැතත් අපි කරපු කැපකිරීම ගැන සලකා බලා පාසල මට ආනන්ද වර්ණ ලබා දුන්නා. ඒක මට විශේෂ දෙයක්. මට ශිෂ්‍ය නායකයෙක් විදිහට අයදුම් කරන්න කියල කිව්වේ මගේ පන්තියේ යාලුවෝ. මගේ පන්තිය එම් **3** අදටත් ඒ හැමෝම එකා වගේ ඉන්නවා. මේ හැමෝගෙම දිරිගැන්වීම සහයෝගය එදත් අදත් මාව මේ දුර ගේන්න සමත් වෙලා තියනවා. පරණ මතක ඇහුවහම මට මතක් වෙන විශේෂ දෙයක් තමයි මගේ උසස් පෙළ ප්‍රතිඵල ආපු දවස. අද වගේ අන්තර්ජාලයෙන් ප්‍රතිඵල බැලුවේ නෑ. පාසල් අමතර වැඩ ගොඩක් කරපු හින්ද මම පන්තියෙත් හිටියේ අඩුවෙන් කවුරුවත් පිළිගත්තේ නෑ මම උසස් පෙළ පාස් වෙලා කියලා. යාලුවෝ දැන්වීම් පුවරුවෙන් බැලුවට පස්සේ තමයි පිළිගත්තේ මම උසස් පෙළ සමත් කියලා.

ප්‍ර - ඔව් ඔබතුමා උසස් පෙළ ලකුණු **224**ක් අරගෙන කැලණිය විශ්වවිද්‍යාලයට තේරී පත්වනවා. ඔබ ඇමරිකා එක්සත් ජනපදයේ ගුවන් හමුදා විශ්වවිද්‍යාලයෙන් යුධ මෙහෙයුම් කලාව හා විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධිය හා ලන්ඩන් කිංග්ස් කොලේජ් හි ජාත්‍යන්තර ආරක්ෂාව හා උපායමාර්ග පිළිබඳව ශාස්ත්‍රපති ගෞරව උපාධිය අධ්‍යනය කරනවා. අපිට ඔබ තුමාගේ තරුණ අවධියේ අධ්‍යාපනය ගැන තොරතුරු

ටිකක් සඳහන් කරන්න පුලුවන්ද?

ඉස්සෙල්ලම කියන්න ඕනේ එක එක්කෙනා තමන්ව දකින්න කැමති විදිහ වෙනස්. උදාහරණයකට පණ්ඩිත් අමරදේවයන්ව රසිකයන්ට ඉතා දක්ෂ ගායකයෙක් විදිහට දැනෙන්න පුළුවන්. සමහර විට පණ්ඩිත් අමරදේවයන් කැමති එතුමා තුල හිටපු දක්ෂ වයලින් වාදකයට වෙන්න පුළුවන්. අධ්‍යාපනික ජයග්‍රහණ වලට වඩා මම අගය කරන්නේ මගේ Operational life එක. මම විශ්වවිද්‍යාලයට තේරිලා ඉංග්‍රීසි පාඨමාලාව හදාරමින් ඉන්න කොට මට අවස්ථාවක් ලැබෙනවා කොතලාවල ආරක්ෂක පීඨයට ඇතුළුවන්න. හැම දෙමාපියෙක් වගේම මගේ අම්මයි තාත්තයි කැමති උනේ නෑ. මේජර් සිරිවර්ධන සර් ට පුලුවන් වුනා අම්මාගේත් තාත්තාගේත් ඒ තිබුනු අදහස වෙනස් කරන්න. ඒ නිසා මට මගේ මුල් අරමුණට යන්න පුලුවන් වුනා. ඉංජිනේරු අංශයෙන් අධ්‍යාපනය ලබලා ඉංජිනේරු විශේෂවේදී උපාධිය ලබාගත්ත ඊට පස්සේ ලොකු උනන්දුවක් නොතිබුනත් ගුවන් හමුදාවේ ඉදිරියට යන්න වැඩිදුර ඉගෙනගන්න උනා. බංගලාදේශයේදී Junior Commander & Staff College කියන පාඨමාලාව, ඇමරිකා එක්සත් ජනපදයේ ගුවන් හමුදා විශ්වවිද්‍යාලයෙන්, එංගලන්තයේ King's College එකෙන් පශ්චාත් උපාධින් ලබාගෙන තියනවා. ඒ වගේම ශ්‍රී ලංකා ඉංජිනේරු



ආයතනයේ මම සාමාජිකයෙක්. අධ්‍යාපනික ජයග්‍රහණ කෙසේ වෙතත් මම ගොඩක් ආඩම්බර වෙන්නේ මගේ සේවා ජයග්‍රහණ ගැන.

ප. ඔබ ගුවන් හමුදාව තුළින් බොහෝ ජයග්‍රහණ හිමිකරගත් අයෙක් ගුවන් නියමුවකු ලෙස ඔබේ අමතක නොවන අත්දැකීම් මොනවාද?

ඒ ගැන නං දවසක් විතර කතා කරන්න පුළුවන්. මේ සාකච්ඡාවට වැදගත් වෙයි කියලා හිතෙන සිදුවීම් කීපයක් කියන්නම්. **1989**දී තමයි මම පළමු වරට තනියම ගුවන් යානයක් පදවන්නේ. සෙස්නා **150** කියන ඇමරිකාවේ නිෂ්පාදිත ගුවන් යානයක්. ඒ මොහොත මට අමතක නොවන දවසක්. මට "Green Endowment" කියල පදවියක් හම්බ උනා. ඒක මට ලැබීමට හේතුව තමයි ඔබ දන්නවා ගුවන් යානයකට රෝද **3**ක් තියනවා දිනක් කාර්මික දෝෂයක් නිසා දකුණු පැත්තේ ප්‍රධාන රෝදයක් ගැලවී ගියා. මට සිද්ද උනා එක රෝදයක් නැතුව ගුවන් යානයක් ගොඩබස්සන්න. මමත් මගේ ජ්‍යෙෂ්ඨ ගුවන් නියමුවෙක් හිටියා ප්‍රකාශ් ගුණසේකර කියලා. අපි දෙන්නා නිරුපද්‍රිතව ගුවන් යානය ගොඩබැස්සුවා. තවත් ත්‍රාසජනක අත්දැකීමක් තියනවා. ඒ සිදුවීම මට දැනෙන්නේ මගේ දෙවන ඉපදීම කියලා, **1997** මාර්තු **15** වෙනිදා අනුරාධපුර ගුවන් පථයෙන් සතුරු ඉලක්කයක් සොයා යාමට පිටත් උනා. මේ ගුවන් යානයේ



නියමුවා විදිහට යන්න හිටියේ මම නෙවෙයි. නමුත් ගමන පිටත් වීමට අණ ලැබීම් ප්‍රමාද වීම නිසා මම මගේ මිත්‍රයට කිව්වා ඔයා ගෙදර යන්න මම තනිකඩයනේ, මම ගිහින් එන්නම් කියලා. කොහොම හරි ගුවන්ගත වෙලා විනාඩි **12-15** කින් විතර ගුවන් යානය කෑලි කෑලි වලට පුපුරලා ගියා.

**"1989දී තමයි මම පළමු වරට තනියම ගුවන් යානයක් පදවන්නේ. සෙස්නා 150 කියන ඇමරිකාවේ නිෂ්පාදිත ගුවන් යානයක්. ඒ මොහොත මට අමතක නොවන දවසක්. මට "Green Endowment" කියල පදවියක් හම්බ උනා. ඒක මට ලැබීමට හේතුව තමයි ඔබ දන්නවා ගුවන් යානයකට රෝද 3ක් තියනවා දිනක් කාර්මික දෝෂයක් නිසා දකුණු පැත්තේ ප්‍රධාන රෝදයක් ගැලවී ගියා. මට සිද්ද උනා එක රෝදයක් නැතුව ගුවන් යානයක් ගොඩබස්සන්න."**

එතකොට මම හිටියේ අඩි 10,000ක් විතර උඩ. වටේම තිත්ත කළුවරයි. මට තීරණයක් ගන්න උනා. ප්‍රහාරක යානා වල තියෙනවා Ejector seat කියලා ඔප්ෂන් එකක්. මම ක්ෂණිකව eject කළා මට ඒකට සිහිය තිබුණා. ඒ තමා ගුවන් හමුදාවේ මම ලබපු පුහුණුව. කැලෑවකට වැටිලා ඊළඟ දවසේ තමා හොයාගෙන එලියට අවේ. පරීක්ෂණ වලට අපු අය පුදුම උනා ඒ ක්ෂණික තීරණය ගැන. මගේ සේවා කාලය අවුරුදු **35** ක්. ඒ කාලයේ තිබුන සියලු සංග්‍රාමයන් වලට මම දායක වෙලා තියනවා. ප්‍රහාරක ගුවන් නියමුවෙක් විදිහට, නිරීක්ෂණ ගුවන් නියමුවෙක් විදිහට ප්‍රවාහන ගුවන් නියමුවෙක් විදිහට මම දායකත්වය දීල තියෙනවා. මම ඒ ගැන ගොඩක් ආඩම්බර වෙනවා.

ප්‍ර - ඔබ ගුවන් හමුදාවේ ලබාගත් පදක්කම් රැසක් තියනවා. රැකියාවට අමතරව ඔබ ක්‍රීඩාව තුළත් නිරත වෙනවා. ඔබට ගුවන් හමුදා වර්ණ තියෙනවා. ගුවන් හමුදා මළල ක්‍රීඩා සංගමයේ සභාපතිත්වය උසුලනවා. මේසපන්දු , ටෙනිස්, ගොල්ෆ් ඇතුළු ක්‍රීඩා රැසක ඔබ සජීවීව ඉන්නවා. මේ

සියල්ලටම පදනම ගම්පහ අත්තනගලු ඔයේ කළ ජල ක්‍රීඩා ද?

ඔබ හරි මගේ දෙමව්පියන්ට ලොකු වත්තක් තිබුනා. ඒ වත්තට එහා පැත්තේ තිබුනේ අපේ කුඹුර. ඒ කුඹුරත් එක්ක තමයි අත්තනගල්ල ඔය තිබුනේ. ඊට එහා පැත්තෙන් රේල් පාර හා පන්සල. අර ගමයි පන්සලයි වැවයි දාගැබයි වගේ මට තිබුනා කුඹුරයි අත්තනගල්ල ඔයයි පන්සලයි. මේ වටපිටාව අපිට ලොකු පන්නරයක් දුන්නා. අපි වැවට පැනලා



පිහිනුවා. පායන කාලෙට කුඹුරේ ක්‍රිකට් ගැහුවා. ඒ අභාෂය තිබුනු මට ගුවන් හමුදාව පහසුකම් ගොඩක් දුන්නා. ජීවිතය දිගු ඉගෙනුම් ක්‍රියාවලියක්. හැම දෙයින්ම අපි ඉගෙනගන්නවා.

ප්‍ර - ඔබ කොතරම් කාර්යබහුල උනත් ආනන්දයේ ආදි ශිෂ්‍ය සංගමයට, ආදි ආනන්දීය ක්‍රීඩා සමාජයට, ආදි ආනන්දීය වෘත්තීයවේදීන්ගේ සංගමයට නොඅඩුව දායකත්වය දෙනවා. එය අපිට ඉතා ගෞරවයක්. ඉදිරියේදී ඔබ ආනන්දයට දෙන දායකත්වය කොහොමද? ඒ සඳහා ඔබතුමන් කාලය කළමනාකරණය කරගන්නේ කොහොමද?

ඔබ කියන ප්‍රශ්නය මට දැනිලා තියනවා. මීට අවරුද්දකට කලින් මට කාලය කළමනාකරණය කියන එක ප්‍රශ්නයක් උනේ නෑ. නමුත් පසුගිය හය මාසයේදී එය මට අභියෝගයක්. නමුත් තව මාසයක් යන කොට යථාතත්වයට පත් වෙනවා. මට හිතෙනවා නම් තියන කාලයෙන් මගේ වැඩ ටික කරගන්න බෑ කියලා ඒකෙන් කියන්නේ මම මට අවශ්‍ය නැති දේවල් ටිකක් කරනවා කියන එක . ඔබ කිව්වා වගේ දැනටමත් මම ආදි ආනන්දීය ක්‍රීඩා සමාජයේ, ආදි ආනන්දීය වෘත්තිකයන්ගේ සංගමයේ සම ලේකම්වරයෙක් විදිහට වැඩකරනවා. ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සාමාජිකයෙක් විදිහට වැඩ කරනවා. ඉදිරියටත් ඒ දායකත්වය මම දෙනවා. මේ දේවල් කරන්න ගුවන් හමුදාව ඇතුලේ ඉන්න ආදි අනන්දීයන්ගෙන් ලැබෙන සහයෝගයත් මම මතක් කරන්නම ඕනේ.

ඔබ දන්නා විදිහට ආදි ආනන්දීය වෘත්තිකයන්ගේ සංගමය මුල් වෙලා අපි STEAM Education Center එකක් ගොඩනගන්න හදනවා. අපි එය නම් කරන්නේ Center of Excellence කියලා. මේක ලංකාවේ අධ්‍යාපන වැඩසටහනේ ලොකු පෙරලියක්. මෙය ලංකාවේ ක්‍රියාත්මක වන පළමු ව්‍යාපෘතිය. අපේ පස්මහල මේ වෙනුවෙන් සම්පූර්ණයෙන්ම වෙනස් වෙනවා. මෙය මිලියන **330**ක විශාල ව්‍යාපෘතියක්. ලෝකේ වටේම ඉන්න ආදි ආනන්දීයන් මේ වෙනුවෙන් දැනටමත් සහාය දක්වනවා. මම සියලුම ආදි ආනන්දීයන්ගෙන් ඉල්ලා සිටිනවා. අපේ අනාගතය වෙනුවෙන් මෙයට සහාය දක්වන්න කියලා. ඒ වගේම ආනන්දයේ ක්‍රීඩාව පෙර තිබු තැනටත් වඩා හොඳ කීර්තිමත් ස්ථානයකට ලඟා කරවීමට අපගේ ගරු විදුහල්පතිතුමන් ලාල් දිසානායක මැතිතුමා, ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න මැතිතුමා වටා පෙළගැසී මේ කර්තව්‍යය අපි කරනවා.

ප්‍ර - මේ අවුරුදු ගණන පිටුපසට හැරී බලද්දී ළමා කාලය , ආනන්දය , ගුවන් හමුදාව එක්ක ගෙවුණු ජීවිතය ඔබට මොනවද දැනෙන්නේ,

මම ජීවිතයේ ඉතා සුන්දර ගමනක් ඇවිල්ල තියනවා. මම ජීවත් වන්නේ ඉතාමත් සතුටින් මට පසුතැවීම් නෑ. ඇත්තටම මම අද මේ මොහොතේ ජීවත්වන කෙනෙක්. මට ආනන්දය කියන්නේ ජාතික වස්තුවක්. මම ඉස්කෝලේ යන කාලේ හැම ආගමකම යාලුවෝ මට හිටියා. ආනන්දය ආගමකට සීමා වන්න ඕනේ තැනක් නෙවෙයි. මෙය සියලුම ආගමික දරුවන්ට විශිෂ්ටත්වය සොයා යා හැකි තැනක්. මගේ අතීතය ගැන මම බොහෝම ආඩම්බර වෙනවා. මට පුළුවන් විදිහට රටට ආනන්දයට ගුවන් හමුදාවට සාධාරණ සේවාවක් ඉටුකර ඇති බව මම හිතනවා.

ප්‍ර - මේ සියලු සාර්ථකත්වයන් පිටුපස ඔබේ ආදරණීය පවුල ඔබ සමග සිටිනවා. බිරිඳ ඉනෝකා, මියුනි දියණිය, ඉනුර පුතු පිළිබඳවත් ඔබට සඳහන් කරන්න දෙයක් ඇති,

මම ඔබට කලින් කිව්වා වගේ මගේ ජීවිතයේ වීරයා තමයි මගේ පියා. මගේ බිරිඳටත් එතුමියගේ දෙමාපියන් ඇරුනහම මගේ පියා ඇයගේත් වීරයා. දැනට මට ශක්තිය දෙන්නේ මගේ මව හා බිරිඳ. මට ගුවන් හමුදාවේ මෙච්චර දුර එන්න මගේ පිටුපසින් හිටියේ මගේ බිරිඳ. ගුවන් හමුදාවට මම කාලය කැපකරද්දී මගේ දරුවන් දෙන්නව ආරක්ෂා කරගෙන ඔවුන්ට උගන්නගෙන රැකබලාගෙන දීපු ශක්තිය මට ඉතා ඉහල මානසික නිදහසක් ගෙන දුන්නා. මගේ ගුවන් හමුදාව තුල ලද ජයග්‍රහණ වලින් වැඩි කොටසක් අයිති වෙන්නේ මගේ භාර්යාව ඉනෝකා රාජපක්ෂ මැතිනියට. මම විශ්වාස කරනවා මේ රටේ වැඩිම ආදරයෙන් හා බැඳීමෙන් ඉන්න පවුල මගේ පවුල කියලා.

ප්‍ර - ඔබේ සමාජ පසුබිම, අධ්‍යාපනය , ජීවිත සාර්ථකත්වය මේ සියල්ල සැලකීමේදී ඔබට තවත් අයකුට දිරි ගැන්වීමක් අවවාදයක් දිය හැකියි. ඉතින් අපේ ආනන්දීයන්ට ඔබ ලබාදෙන පණිවිඩය කුමක්ද ?

ආනන්දය කියන්නේ වයසට ජ්‍යෙෂ්ඨත්වයට ගරු කරපු තැනක්. මට වඩා වයසින් වැඩි ඕනෑම අයකුට අදටත් මම අයියේ කියල කතා කරනවා. ඒකට තනතුර තත්ත්වය අදාළ නෑ. ඒ ආනන්දයෙන් අපි ඉගෙනගත්ත දේ. මට දෙන්න තියන පණිවිඩය තමයි අපි ආනන්දයෙන් බිහිකරන්න ඕනේ නායකයන්, පරිපූර්ණ පුද්ගලයන්, මනා පෞර්ෂත්වය තියන අය. මේ නායකත්වය හා පෞර්ෂත්වය තමයි චරිත බිහිකරන්නේ. දැනුම න්‍යාය පොතපතින්,පංතියෙන්, අන්තර්ජාලයෙන් හොයන්න පුළුවන්. ආනන්දය පෙළගැහෙන්න ඕනේ නායකයන් බිහි කරන්න. ඒ අයට ලෝකය දිනන්න හරිම පහසුයි. එය රටේ අනාගතයයි.

අනිවාර්යයෙන්ම ආනන්දය යනු නායකත්වයත් පෞර්ෂත්වයත් ක්‍රීඩා කෞෂල්‍යයත් ගොඩනැංවිය යුතු තැනක්. එය අතීතයේ සේම අනාගතයේද අපගේ වගකීමයි. මෙවර ආනන්දය සඟරාව උදෙසා අප හා මෙම සංවාදය වෙනුවෙන් කාලය කැපකළ ශ්‍රී ලංකා ගුවන් හමුදාපති එයාර් මාෂල් උදේනි රාජපක්ෂ මැතිතුමාට ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ කෘතවේදීත්වයත් ගෞරවයත් ප්‍රකාශ කරනවා. බොහොමත්ම ස්තුතියි.

# අනඳ සිසු භටයෝ දශක දෙකක ඉඩෝරය නිමා කල වගයි!!!



**විසිඑක් වසරක නිහැඬියාව බිඳ දමමින් අනද සිසු භටයෝ හර්මන්ලූස් කිරුළ තම මවු තුරුලට ඇගේ 137 වන ජන්ම දිනයෙදීම ගෙන ආ බව සතුටින් දැනුම් දෙමු**. 1920 දී ගමන් ආරම්භ කළ විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය භට බණ්ඩය එදා මෙදා තුර වසර 103 ක ප්‍රෞඩ ඉතිහාසයක් තුළ දහනම වතාවක් හර්මන්ලූස් කිරුළ දිනාගෙන ඇත. දිවයිනේ වැඩිම වාර ගණනක් හර්මන්ලූස් කුසලානය දිනූ එකම පාසලද ආනන්ද විදුහලයි. දිවයිනේ වැඩිම වාර ගණනක් අනවර්ථව හර්මන්ලූස් කුසලානය දිනූ පාසල ලෙස ද, (1990, 1991, 1992 සහ 1993) ප්‍රථම වතාවට (1993) ජනාධිපති බණ්ඩය ලෙස විරුදාවලිය ලත් පාසල ලෙසද ආනන්ද විද්‍යාලය පත් වී ඇත. මෙවරද ඉතිහාසය අලුත් කරන්නට ආනන්දය සමත් වී ඇත. ඒ ජාතික ශිෂ්‍ය භට බළකායට ලබාදුන් ජනාධිපති වර්ණ ප්‍රථම වතාවේ දීම හිමිකර ගැනීමට මෙවර සමත් වීමයි.



**Rithmika Thehas Kiringoda** of the Primary section of Ananda College has managed to emerge victorious as the Champion of the World Chess Championship 2023 in the under 9 category. The championship was held in Athens,Greece with the participation of 61 chess players from 24 different countries



## “Congratulations" We're so very proud of you!



Ananda Tennis Green Ball -A & Orange Ball - A Teams emerged victorious, becoming the champions at the All Island Tennis Championships 2023.



Ananda College U18 table tennis team won the national schools table tennis championship.



Present Anandian Manuja Gamage representing Sri Lanka in World Aquatics Junior Swimming Championships 2023 in Isreal.



RuvishanPerera, a shining star from Ananda College, is set to make history once again as he proudly represents Sri Lanka in the U-19 youth national team!




Sudam Liyanage of Ananda College, who has secured a spot in the lineup for the U-16 FIBA Asian Championship SABA Qualifier Tournament, proudly representing Team Sri Lanka.



Blue and Gold Hockey Sevens 2023, U19 All Island Schools Hockey 7s Tournament Organized by Royal College, Colombo. Ananda College won the Plate Championship



The Under 16 Badminton team of Ananda College has emerged as the Runners up of the National Schools Western Province Badminton Championship 2023



Ananda Table Tennis ,Under 12 Inter School A DivisionChampions 2023




ALL ISLAND INTER SCHOOL UNDER 13 DIVISION 1 TENNIS CHAMPIONS ANANDA COLLEGE - A TEAM




ALL ISLAND INTER SCHOOL UNDER 15 TENNIS CHAMPIONS ANANDA COLLEGE COLOMBO



Sandas Usgodaarachchi won the U18 boys Singles and Doubles titles in Sri Lanka Hard Court Championship 2023 recently held at Sri Lanka Tennis Association (SLTA) Colombo.



National Junior Athletic Championship 2023. VenujaPerere won U-16 Hammer Throw Gold Medal.




Ananda College now has the 100M Under 20 FASTEST men in Sri Lanka!!! Crowned Gold & Silver at recent events…. Merone & Vidushan.



Ananda College won the Vanlangenberg Trophy at the Colombo Rowing Club Opening Regatta 2023.



Our Under 17 A Team emerged Champions at the all Island Under 17 Badminton tournament held in Bandarawela



Our under 15 Badminton team captain Senuth Perera was selected to represent Sri Lankan team for the south Asian region games to be held in Nepal.




Present Anandian Abhilash Indisa, Medal winning shooter represent Sri Lanka 15th Asian Shooting Championship held in Korea.



Ananda College emerged victorious as the All-Island Shakespeare drama competition 2023 for delivering an emotional performance of Macbeth.

Continued to page No. 27 Back Inner

Continued from page No. 13


# ACOBA ACTIVITIES

## Anandians represent Motherland in Global stage, powered by ACOBA










## "අත්වැල" - කෙලිබිමයි - පොතපතයි සමබරව

ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ ක්‍රීඩා අනුකමිටුවේ සංකල්පයකට අනුව ආනන්ද විද්‍යාලය නියෝජනය කරන ක්‍රීඩකයන්ගේ අධ්‍යාපනික කටයුතු සමබරව පවත්වාගෙන යාම සඳහා "අත්වැල" අධ්‍යාපනික වැඩසටහන නොවැම්බර් මස 16 වැනි දින විද්‍යාලයීය පරිශ්‍රයේදී ගරු විදුහල්පති තුමා ඇතුළු ආචාර්ය මණ්ඩලයෙත්, ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාපතිතුමා ඇතුළු විධායක කමිටු සාමාජිකයන්, දෙමව්පියන් සහ දයාබර සිසු දරුවන්ගේ සහභාගිත්වයෙන් ආරම්භ කරන ලදී.

මෙහි ප්‍රථම අදියර ලෙස 2023 වසරේ අධ්‍යාපන පොදු සහතික සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින ක්‍රීඩකයින් වෙනුවෙන් සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉතිහාසය යන ප්‍රධාන විෂයයන් ආවරණ පරිදි සතියේ දිනවල සවස 2.00 - 3.30 දක්වා අමතර පන්ති පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මෙමගින් ක්‍රීඩාවෙහි නියැලීම නිසා දරුවන් හට මගහැරෙන අධ්‍යාපන කටයුතු වඩාත් විධිමත් ලෙස අපොස සාමාන්‍ය පෙළ විභාගය ඉලක්කගත කොටගෙන විද්‍යාලයීය ආචාර්ය මන්ඩලයේ අනුශාසකත්වය හා මඟපෙන්වීම යටතේ "අත්වැල" අධ්‍යාපනික




## අනද අබිමන් වැඩසටහන 2023

ආනන්ද විද්‍යාලීය ආදිශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද අනද අබිමන් වැඩසටහන 2023අගෝස්තු මස26 වනදින කළුතර Tangerine හෝටලයේ දී පැවැත්වුණි. මේ සදහා පාසලට පැමිණි නවක ගුරු මහත්ම මහත්මින් සහ පාසලේ කළමනාකරණ මණ්ඩලය සහභාගී විය. මෙහිදී ආනන්දයේ අතීතය සහ ආනන්දයෙන් පාසලට සමාජයට සිදුවිය යුතු යුතුකම් පිලිබඳව සාකච්ඡා කෙරුණි. පූජ්‍ය වේපතඉර හේමාලෝක ස්වාමීන් වහන්සේගේ අනුශාසනාවකින් ඇරඹි මෙම වැඩසටහනේ කිර්තිමත් ආදි ආනන්දීයන් වන මහාචාර්ය හරේන්ද්‍ර සිල්වා, මහාචාර්ය ජේ.බී. දිසානායක, මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර, ඩෙන්සිල් පෙරේරා මහතා සහ ආදි ශිෂ්‍ය සංගමයේ හිටපු සභාපති ලලිත් සේනානායක මහත්වරුන් විසින් දේශන පවත්වන ලදී. මෙම වැඩසටහන අති සාර්ථකව පැවැත්වුණු අතර ඒ සදහා සහභාගි වූ සියලුම දෙනාගේ නොම දපැසසුමට ලක් විය.



## උසස් පෙළ සිසුන් සඳහා කරනු ලබන සම්මන්ත්‍රණ මාලාව

උසස් පෙළ සිසුන් ඉලක්ක කරගෙන පවත්වනු ලැබූ සම්මන්ත්‍රණය සඳහා සිසුන් 500ක් පමණ සහභාගි විය. එහෙදි ඒ සදහා ආරාධිත පාසල් කිහිපයක සිසුසිසුවියන් ද සහභාගි විය.මහාචාර්ය එස්.ආර්.ඩි.රෝසා මහතා විසින් 2023 ජුලි මස 24 වන දින විද්‍යාලීය කුලරත්න ශාලාවේදී මෙම වැඩසටහන පවත්වන ලදී. මෙහිදි භෞතික විද්‍යාව විෂයට අදාලව පසුගිය වසරවල උසස් පෙළ ප්‍රශ්න පත්‍ර සාකච්ඡා කෙරුණි. මෙම වැඩසටහන අති සාර්ථකව නිමාකිරීමට හැකිවුන අතර ආචාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ නොමද ප්‍රශංසාව හිමිවිය.



## ප්‍රාථමික අංශයේ සිසුන්ගේ ඉංග්‍රීසි මාධ්‍ය කුසලතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන

Trinity අධ්‍යාපනික ආයතනය සමගින් එකතුවී ප්‍රාථමික අංශයේ සිසුන්ගේ ඉංග්‍රීසි මාධ්‍ය කුසලතාව වැඩිදියුණුකිරීම උදෙසාකරනු ලබන කරන ඉංග්‍රීසි අධ්‍යාපනික වැඩසටහන නව ආකාරයකින් කරගෙන යාමට අවශ්‍යක කටයුතු සුදානම් කරමින් පවතී. මේ සඳහා විදේශරටවල සිටින ආදි අනන්දීයන්ගේ අනුබද්ධිත කණ්ඩායම් කිහිපයක් සහයෝගය දැක්වීමට කැමැත්ත පල කර ඇත.

## තාක්ෂණවේදය විෂය හදාරන අප විද්‍යාලයේ සිසුන් සඳහා විශේෂ අධ්‍යාපනික වැඩසටහන

2023 වසරේ ඔක්තෝබර් මස 3 වනදින තාක්ෂණවේදය විෂය හදාරන අප විද්‍යාලයේ සිසුන් සදහා විශේෂ අධ්‍යාපනික වැඩසටහනක් සබරගමුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන සංවිධානය කිරීමේදී ආදි ආනන්දීය සබරගමුව විශ්වවිද්‍යාලයේ ආචාර්ය නලින් පුස්සැල්ල මහතාගේ නොමද සහයෝගය ලැබුණි.

# OVERSEAS WINGS AOA-UK

The Association of Old Anandians in the UK (AOA UK) was inaugurated in 1982, so it has served our alma mater and Anandian community in the UK for over four decades now. The main objectives of our association are to develop educational and sports activities, and financially assist needy students at Ananda College. 2023 has been another very successful year for our Association from all fronts. Below are a snapshot of activities during the current year.

## Projects

### Rowing boat

Last year we donated USD 10,300 towards buying a brand-new rowing boat for the College rowing crew. After some delays in clearing the boat at Sri Lanka Customs, we managed to deliver it to the boys at a launching ceremony held at the Colombo Rowing Club on the 13th of July. The event was attended by the Principal, college officials, AOA UK officials, and college rowing crew.



### Badminton

We donated Rs 300,000 to the Ananda College Badminton Association to purchase feather shuttles which they needed for their entire 2023 season. With this support, our boys have managed to emerge as runners-up in the under-15 All Island Interschool championship.

### AvuruduUthsawaya

The Sinhala New Year, known locally as 'AluthAvurudda,' is a radiant celebration that marks the end of the harvest season and the beginning of a new lunar year in Sri Lanka. On Sunday 23rd April at Tudor Park Sports & Leisure Centre in London, Anandians in the UK and their families and friends celebrated this important event with a fitting show that consisted of traditional sweets, games, songs, dances, dramas, etc. From the sweet aroma of kavum and kokis wafting through the air to the joyful sounds of firecrackers and raban drums, every moment is a heartfelt expression of gratitude to nature and a prayer for prosperity. As families gather to light the hearth, share meals, and exchange gifts, the Sinhala New Year unites the island nation in a beautiful tapestry of unity, hope, and renewal.



### Summer Ball

The annual Summer Ball is not just an event; it's an eagerly awaited tradition that brings our community together under the starlit sky. This is also our main fundraising event of the year and it was held on Saturday 24th June at the Royal National Hotel in London. Every year, as the warm breeze carries the scent of blossoming flowers, our members and supporters gather in their finest summer attire, united by a shared purpose: to raise crucial funds for our cause. The evening is a spectacular fusion of elegant dining, lively entertainment, and heartfelt generosity. The twinkling lights, soft melodies, and contagious laughter create an enchanting atmosphere, but it's the spirit of giving and the palpable passion for our mission that truly sets the night apart. The Summer Ball stands as a testament to the power of collective action, and the funds raised set new benchmarks, enabling us to make a difference at our Alma mater.

### English development program

We've agreed to Fund Rs 655,00 for an English development programme for the hostellers. Around 150 hostellers in Grades 6, 7 and 8 will benefit from this programme by enhancing their English proficiency and spoken communication skills. This programme is spearheaded by the Ananda College batch of 2006, who will manage the programme at the college premises.



## Events

### 40th Anniversary Celebrations

AOA UK celebrated its 40th anniversary on Saturday 3rd December at the Hilton Watford in London. Celebrating the 40th anniversary of our Association is not merely a testament to the longevity and endurance of our institution, but a reflection of the shared commitment, passion, and purpose that have bound us all these years. As we stand at this significant milestone, we are reminded of the countless memories created, challenges overcome, and successes achieved, all woven together into the rich tapestry of our shared history. This is a moment to

honour the visionaries who laid the foundation, applaud the relentless spirit of those who've sustained and nurtured it, and inspire the new generation to carry the legacy forward. Let this 40th year be a beacon that illuminates our past achievements and paves the way for a future filled with even greater accomplishments.







**Festival of Cricket**

Participating in the Festival of Cricket in the UK was an experience that transcended the boundaries of mere sport. This year too Ananda College took part in this wonderful event with a young and talented team of Anandians. It was held on the 9th of July at Hainault Recreation Ground in East Lodnon. The festival was not just about the thrill of the game, but a confluence of cultures, camaraderie, and shared passion for cricket. Every match was a tapestry of powerful shots, impeccable fielding, and strategic plays, echoing with cheers and support from fans who came from all corners of the country. Being a part of this event was not just about playing cricket; it was about being woven into the Sri Lankan community in the UK, united by the love for the Gentleman's Game.

**Big Match**

The Ananda-Nalanda Big Match is not just another cricket encounter; it's an age-old rivalry and a celebration that encapsulates the spirit and traditions of two of Sri Lanka's most esteemed educational institutions. This year's Battle of the Maroons UK was held on the 28th of August at the Finchley Cricket Club in London. Both Anandians and Nalandians in the UK played this much-anticipated match with the true spirit of the encounter. This year, Anandians won the main match and Nalandians won the over-40s match. Alumni, young and old, rally around their teams, reliving their school days and reigniting friendships that time has failed to diminish. Off the field, amidst the fluttering flags and festive stalls, the camaraderie is palpable, as generations come together to celebrate not just a sporting event,but a legacy.








## කැටපත්පවුර

# ශ්‍රී ලාංකේය සිනමාවේ අනද සලකුණු

ආනන්දය වසර **137** ක ප්‍රෞඪත්වය සමරද්දී ත්‍රෛකාලික ආනන්දියෝ සිනමා වංශකතාව අදටත් පෝෂණය කරමින් සිටිති. අතීත ආනන්දීයන් සිනමා කර්මාන්තයට සිදුකළ අපරිමිත දායකත්වය අගයන "ආනන්දය" සඟරාවේ මෙවර උත්සාහය ශ්‍රී ලාංකේය සිනමාවේ අනද සලකුණු සොයා යන්නටය.

මේ සාකච්ඡාව සඳහා අප ආරාධනා කළේ අචාර්ය නුවන් නයනජිත් කුමාර මහතාට, ඔහු ශ්‍රී ලාංකේය කලාවට සාහිත්‍යයට සිනමාවට ආනන්දනීය දායකත්වයක් සපයන්නෙක්. කලාකාමී සාහිත්‍යමය පවුල් පසුබිමකින් උපන් ඔහු පාසල් අවධියේ නිර්මාණ පද්ම සම්මාන උළෙලේදී ගද්‍ය හා පද්‍ය අංශයේ හොදම ලේඛකයා වෙමින්ද විනය ගරුක හා දක්ෂතම දක්ෂතා දැක්වූවන්ට පිදෙන පී.ද එස්.කුලරත්න අනුස්මරණ ශිෂ්‍යත්වය හිමිකර ගනිමින්ද පාසල තුළ දක්ෂතා දැක්වූ සාහිත්‍යයට ඇලුම් කරන්නෙක් බවට පත්විය. ශ්‍රී ලංකා සිනමාවට අපූර්ව දායකත්වයක් හා පෝෂණයක් ගෙනෙන ඔහු තම ආචාර්ය උපාධිය සඳහා දේශීය විශ්ව විද්‍යාලයක් තුළින් සිනමාව පිළිබඳ නිබන්ධනයක් කළ පළමු වැන්නාය. වසර **19**ක් පුරා සිදුකළ පර්යේෂණයන්ගේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින ˜Sri Lanka Film Chronicle" ග්‍රන්ථය ශ්‍රී ලංකා සිනමාවේ අක්මුල් සොයා යයි.








ආයුබෝවන් නුවන් අයියේ...

ආයුබෝවන් මල්ලි...

ප්‍රශ්නය : අපි මුලින්ම සොයා යමු ශ්‍රී ලංකා සිනමා ඉතිහාසයේ ආනන්ද දායකත්වය කොතරම් දුරට විහිදී යනවද කියලා

ලංකාවේ සිනමා ඉතිහාසයට අනුව කථා නාද සිනමාව **1947** දී කඩවුණු පොරොන්දුව චිත්‍රපටයෙන් ආරම්භ උනත් අපේ සිනමාවේ ආරම්භය විදිහට කථා කරන්නේ නිහඬ සිනමාවයි. මුල් කාලේදී නිහඬ සිනමා කෘති **2**ක් බිහි උනා. ඉන් පළමු වැන්න තමයි **1925**දී නිෂ්පාදනය වුනු රාජකීය වික්‍රමය නොහොත් ශාන්තා කියන චිත්‍රපටය. අවාසනාවකට මේ සිනමා කෘතිය තිරගත උනේ ඉන්දියාවේ හා සිංගප්පූරුවේ පමණයි. කුමන්ත්‍රණායක ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට ගෙන එන අතර වාරයේ ගුවන් යානයේදීම ගිනිබත් වෙනවා. මේ සිනමා කෘතියේ ප්‍රධාන චරිතය රගපෑවේ බොහොම කීර්තිමත් ආදී ආනන්දීයකු වන අචාර්ය එන්.එම්.පෙරේරා මහතා. ඔහු ආනන්දයේ ඉගෙනුම ලබා විශ්වවිද්‍යාලයට යාමටත් ප්‍රථම තමයි මෙම චිත්‍රපටයේ ප්‍රධාන චරිතය වන රාජකුමාරයකුගේ චරිතයක් රඟපාන්න හැකියාව ලැබෙන්නේ, ඔහු ඒ කාලේ ඉතා කඩවසම් තරුණයෙක්. මෙය ලංකාවේ තිරගත උනානම් ඔහුව අපි හඳුනා ගන්නේ දේශපාලකයකු විදිහට නෙමේ දක්ෂ නළුවෙකු විදිහට වෙන්නත් තිබුනා. ඒ විදිහට බලද්දී ලංකාවේ පළමුවන නිහඬ චිත්‍රපටයේ ප්‍රධාන නළුවා කීර්තිමත් ආනන්දීයෙක්.

ප්‍රශ්නය : ඔබේ පැහැදිළි කිරීම අනුව ලංකාවේ පළමු චිත්‍රපට වීරයා , පෙම්වතා ආනන්දීයෙක් ඉන් පසුව ආනන්දයෙන් බිහි වූ විශිෂ්ට සිනමාකරුවන් කවුරුන්ද?


මම මේ දවස්වල පලකරන්න වැඩකරගෙන යන කෘතියක් තියනවා ආනන්ද වංශය කියලා. අවුරුදු හතක විතර පර්යේෂණයක්. එකේ එක පරිච්ඡේදයක්ම තියනවා ආදි ආනන්දීයන් වෙනුවෙන්. හැබැයි මේ ප්‍රශ්නය පුළුල්. සිනමාවට සම්බන්ධ වුනු බොහෝ ආනන්දීයන් ඉන්නවා. මම දැන් නම් කරන්නේ මගේ මතකයේ රැඳෙන අය ගැන. මට මතක් වෙනවා දයානන්ද ගුණවර්ධනයන් එතුමන් කෘතහස්ත නාට්‍යවේදියෙක් වගේම චිත්‍රපට නළුවෙක් විදිහටත් දායක උනා. කුරුළු බැද්ද චිත්‍රපටය ඒ වගේම බක්මහ දීගය චිත්‍රපටයේ අධ්‍යක්ෂවරයා ඔහුයි. සියවස් සැමරුම වෙනුවෙන් ආනන්ද ජවනිකා නිර්මාණය කළේද එතුමන් විසින්. ඒ වගේම ජී.ටී.වික්‍රමසිංහ මහතා, එතුමන් පුවත්පත් කලාවේදියෙක් ඒ වගේම චිත්‍රපට චරිතාංග නළුවෙක් විදිහට චිත්‍රපට රැසකටම දායක වෙලා තියනවා. මීළඟට ඩැනියල් මුතුමාල මහතා බක්මහ දීගේ චිත්‍රපටයේ මුදලිගේ චරිතය රඟපෑවා. ඔහු චිත්‍රපට රැසක රඟපාලා නැතත් බක්මහ දීගේ චිත්‍රපටයේ මුදලිගේ චරිතයට අතිශය සාධාරණයක් ඔහු කළා. කෘතහස්ත ජන සන්නිවේදන මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන් තිරනාටක රචකයෙක් වගේ මෙන්ම චිත්‍රපට ගීත රචකයෙක් විදිහට සිනමාවට නෑකම් කියනවා. එතුමන් ඩී.බී.නිහාල්සිංහයන් එක්ක පාසල් සමයේම "තරුණාවිය" කියලා කෙටි චිත්‍රපටයක් කරනවා. පියසේන නිශ්ශංක මහතා පුවත්පත් කලාවේදියෙක් වගේම නවකතා කරුවෙක්. නමුත් එතුමන්ගේ වදුල නවකතාව චිත්‍රපටයකට ගොඩ නැගුනා. ඒ අනුව චිත්‍රපට කතා රචකයකු ලෙස පියසේන නිශ්ශංක මහතාවත් අපට සිනමාවේ ආනන්ද සලකුණක් ලෙස සලකන්න පුළුවන්. රෙජී සිරිවර්ධන මහතා ආදි අනන්දීයෙක් විදිහට එතුමන් තමයි ජාත්‍යන්තරව සම්මානයට පාත්‍ර වුනු පළමු වෘත්තාන්ත චිත්‍රපටය වන ගම්පෙරලිය සිනමා කෘතියේ තිරනාටකය රචනා කලේ. ඒ වගේම ලංකාවේ සිනමා විචාරය ගැන කතා කරන විට එතුමා විශිෂ්ට ගණයේ සිනමා විචාරකයෙක්.එතුමන් තමයි සිනමාවේ සෞන්දර්ය වාදී විචාර කලාවක් ගොඩනගන්නේ.

**50 / 60 / 70** දශකයේ බැබලුනු තරුවක් තමයි ආනන්ද ජයරත්න. බටහිර පන්නයේ හැඩයකින් සිනමාවට පැමිණි ඔහු බොහොම කඩවසම් නළුවෙක්. ඔහු සුරතලී , සංදේශය චිත්‍රපටවල ප්‍රධාන චරිතය කළා. අදටත් ඔහු ක්ෂේත්‍රයේ අමරණීය නළුවෙක් විදිහට සලකන්න පුළුවන්.ඒ වගේම අපට අමතක කරන්න බැහැ චිත්‍රපට රාශියක් නිෂ්පාදනය කළ ඊ.ඒ.පි.එදිරිසිංහ මහතා, ඔහු චිත්‍රපට ප්‍රදර්ශනය උදෙසා පුරෝගාමී මෙහෙවරක් කළ චිත්‍රපට නිෂ්පාදක වරයෙක්. ආනන්දය කාටවත් බිඳහෙළ නොහැකි වාර්තා දෙකක් තියලා තියෙනවා. ඒ **1965** පාසල් ශිෂ්‍යයන් විදිහට "වෙර" නමින් කම්කරුවන්ගේ වීර්යය පිළිබඳව කතාවන පළමු පාසල් කෙටි චිත්‍රපටය නිෂ්පාදනය කලේ ආනන්දය. මේ චිත්‍රපටය අධ්‍යක්ෂණය කලේ රංජිත් ලාල් නැමති ආදි ආනන්දීයයා විසින්. ඔහු පසුව සියවස සැමරුම වෙනුවෙන් "අනද සිරිත" කියන කෙටි චිත්‍රපටයද අධ්‍යක්ෂණය කළා. ඒ කාලෙ මේ වෙනුවෙන් දායක උනා මගේ පියා ඒ.ඩි.රංජිත් කුමාර මහතා හා ප්‍රේමකීර්ති ද අල්විස් මහතා කියන කීර්තිමත් ආදී ආනන්දීයන්. ප්‍රේමකීර්ති ද අල්විස් මහතා චිත්‍රපට ගීත රචකයෙක් විදිහට තිරපිටපත් රචකයෙක් විදිහටත් ක්ෂේත්‍රයට දායක වෙනවා. මගේ පියා ඒ.ඩි.රංජිත් කුමාර මහතා වෙර චිත්‍රපටයේ කලා අධ්‍යක්ෂවරයා ඔහු තිර නාටක රචකයෙක්, කලා අධ්‍යක්ෂවරයෙක් වගේම චිත්‍රපට **200** ක පමණ නාමාවලිය නිර්මාණය කළ නිර්මාණ ශිල්පියකු ලෙස ඔහුගේ දායකත්වයත් ලැබෙනවා. ඒ වගේම රංජිත් ලාල් මහතා මගේ පියා ඇතුළු ඒ කණ්ඩායම එකතු වෙලා **1970** දී පාසල් ශිෂ්‍යයන් ලෙස නිර්මාණය කරන පළමු වෘත්තාන්ත චිත්‍රපටය වන "නිම්වලල්ල" නිෂ්පාදනය කරනවා. මේ චිත්‍රපටයට දායක උනා කීර්තිමත් ආනන්දීයකු වන සුනිල් මාධව ප්‍රේමතිලක මහතා. එතුමා තමයි නිම් වළල්ල සිනමා කෘතියේ කථා රචකයා. බන්දුල පද්ම කුමාර තමයි සහාය අධ්‍යක්ෂකවරයා. එතුමා "සරසවි දියණියෝ" කියලා චිත්‍රපටයක් අධ්‍යක්ෂණය කළත් අවාසනාවකට එය තිරගත වුනේ නෑ. ඒ වගේම හිටපු පුරපති රත්නසිරි රාජපක්ෂ මහතා, ආචාර්ය නිමල් හෙට්ටිආරච්චි මහතා රංගනයෙන් දායක වෙලා තියෙනවා. කීර්තිමත් ආදි ආනන්දීය අචාර්ය ඩී.බී. නිහාල්සිංහ මහතා පුරෝගාමී චිත්‍රපට කැමරා ශිල්පියකු විදිහට සිනමා ස්කෝප් කැමරාකරණය හඳුන්වා දෙන්නේ එතුමා. සිනමාවට පිටින් ඔහු පළමු ටෙලි නාට්‍යය දිමුතු මුතු වගේම, පළමු රූපවාහිනී වෙළඳ දැන්වීම නිර්මාණය කළා. අග්‍රගණ්‍ය චිත්‍රපට අධ්‍යක්ෂවරුන් අතර ඔහුගේ නමත් සඳහන් වෙනවා. සිනමා සංස්කරණයේ විශිෂ්ටයා ලෙස අපි සලකන ටයිටස් තොටවත්තයන් ආනන්දීයෙක්. ඔහු තවත් පසෙකින් ශ්‍රී ලාංකික හඬ කැවීමේ කලාවට පුරෝගාමී මෙහෙවරක් කළ අයෙක්. සුමිත්ත

අමරසිංහ මහතාද කැමරාකරණයේ විශිෂ්ටයෙක්. ඉන්දියාවෙන් කැමරාකරණය වැඩිදුර අධ්‍යයනය කරලා ඉතා කලාකාමී රූප රාමු සිනමාවට ගෙනෙන්නට ඔහු නව ප්‍රවේශයන් සොයා යනවා. පසුකාලීනව ඔහු ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපතිවරයා හැටියටත් වැඩකරනවා නාවික හමුදා ක්ෂේත්‍රයේ කීර්තිමත් නිලධාරියෙක් වන රියල් අද්මිරාල් සරත් වීරසේකරයන්, එතුමා ගාමණී චිත්‍රපටය තමන්ගේ අත්දැකීම් ආශ්‍රයෙන්ම බිහිකරනවා. ඒ වගේම සාගරයක් මැද චිත්‍රපටය නිෂ්පාදනය කළ ආනන්ද අබේනායක මහතා ඒකාංගික ටෙලිනාට්‍ය කලාවේත් විශිෂ්ටයා. ලකී ඩයස් මහතා ටෙලි නාට්‍ය කලාවේ වගේම චිත්‍රපට ක්ෂේත්‍රයේත් කෘතහස්ත නළුවෙක්. ඒ වගේම අජිත් ජිනදාස මඩොල් දූවේ උපාලි. ඔහු පසුව චිත්‍රපට ගණනාවකම රඟපෑවා. සිඩ්නි චන්ද්‍රසේකරයන් චිත්‍රපට රැසක අධ්‍යක්ෂණය සේම ගීත රැසක් රචනා කරනවා. විජේරත්න වරකාගොඩ මහතා අපට ඉන්න ජ්‍යෙෂ්ට කලාකරුවෙක්. මෑත කාලීන දක්ෂ නළුවෙක් බුද්ධික ජයරත්න. ඔහු චිත්‍රපට ඇදුම් නිර්මාණයට මෙන්ම පසු කාලීනව අධ්‍යක්ෂණයටත් ප්‍රවේශ වෙනවා. සිනමාවේ මෝස්තර නිරූපන ශිල්පයට දායක වුනු කීර්ති ශ්‍රී කරුණාරත්න, චිත්‍රපට අංගම්පොර සටන් නළුවෙක් වගේම සටන් අධ්‍යක්ෂවරයෙක් වන සඳුන් ප්‍රනාන්දු සහ විදේශගතවද කෙටි චිත්‍රපට නිෂ්පාදනය කරන රෙෂාන් ප්‍රනාන්දු ශ්‍රී ලංකාවේ චිත්‍රපට ක්ෂේත්‍රය තුළ ආනන්දීයන් විදිහට විශේෂයි.







ඒ වගේම ඩෝල්ටන් අල්විස්, කුලරත්න අරියවංශ, ජෝර්ජ් ලෙස්ලි රණසිංහ, මහචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහතා, මෛත්‍රී පනාගොඩ, බණ්ඩාර කේ.විජේතුංග, අරුණ ගුණරත්න චිත්‍රපට ගීත රචනයට දායක වුනු අග්‍රගණ්‍ය ගීත රචකයන්. බණ්ඩාර කේ. විජේතුංග නිර්මාණශීලී වෙළඳ දැන්වීම් නිර්මාණකරුවෙක්.

ආනන්දයෙන් බිහිවුණු චරිතාංග නළුවන් අතර මාපා ගුණරත්න, පියදාස ගුණසේකර, එස්.එච්.ජෝතිපාල, මොරිස් දහනායක, දේවින්ද මාකස්, ඩඩ්ලි වානගුරු, ඩග්ලස් වික්‍රමසිංහ , බන්දුල සූරියබණ්ඩාර , අනුර බණ්ඩාර රාජගුරු, ජයනාත් බණ්ඩාර, අසිරි විජේසේකර, අශෝක පොන්නම්පෙරුම මට මතක් වෙනවා. ඒ වගේම සිනමා පුවත්පත් කලාව සලකන විට සෝමපාල රණවීර මහතා එහි පුරෝගාමියෙක්. ඩී.වී.සෙනවිරත්න සංගීතවේදී සෝමරත්න පෙරේරා, ප්‍රවීණ කැමරා අධ්‍යක්ෂක එම්.එස්.ආනන්ද ඔහු තමා විශිෂ්ට සිනමා කෘතියක් වූ නිධානය කැමරාකරණය කළේ. අග්‍රගණ්‍ය විත්ති කතා හා වාර්තා නිර්මාණය කළ ප්‍රඥාදාසෝම හෙට්ටිආරච්චි මහතා ඔහු රජයේ චිත්‍රපට අංශයේ සේවය කළේ. ජනප්‍රිය චිත්‍රපට ගණනාවක් අධ්‍යක්ෂණය කළ ජෝ දේව් ආනන්ද මහතා ආදී ආනන්දීයෙක්. චිත්‍රපට ගීත ගායකයන් මෙන්ම සංගීත ක්ෂේත්‍රයේ ආනන්දීයන් අතර රෝහණ සිරිවර්ධන අමිත් වල්පොල, ජගත් වික්‍රමසිංහ, මධුමාධව අරවින්ද, ධනංජය සිරිවර්ධන, ගාමින්ද ප්‍රියවිරාජ්, කසුන් කල්හාර, ඉන්ද්‍රචාප ලියනගේ, සහන් රන්වල, ජනනාත් වරකාගොඩ, හර්ෂ මාකලන්ද, භාතිය ජයකොඩි, නිමන්ත හේෂාන් , භානුක මනෝරත්න, සතිෂ් පෙරේරා, ඉසුරු ජයරත්න, සජිත අනුත්තර, හර්ෂණ දිසානායක නිශ්චල ඡායාරූප ශිල්පියෙක් වන කිත්සිරි රතුවිතාන. මම හිතන්නේ බොහෝ දෙනෙක් ආවරණය උනා ආනන්දය බිහිකළ සිනමාවේ විශිෂ්ටයන්.

ප්‍රශ්නය: නිහඬ සිනමාවෙන් පටන් ගෙන ආ ගමන තුළ අප දකිනවා ආනන්දීයන් ලාංකේය සිනමා ක්ෂේත්‍රයට කළ දායකත්වය. ඔබ දකින විදිහට ආනන්දීයන්ගේ දායකත්වය ක්ෂේත්‍රය තුළ කැපී පෙනෙන්නේ ඇයි?

පැහැදිලිවම ටයි මහත්තයා වෙනුවෙන් මම කෘතියක් සම්පාදනය කරලා ආනන්දයේදීම එය පිළිගන්වන වෙලාවේ ටයි මහත්තය කිව්වේ "මම මෙරට කලාව වෙනුවෙන් දායාද කළ දෙයක් වේ නම් ඒ මට ආනන්දය දුන් දේයි" කියලා. ආනන්දයෙන් බිහි වූ හැම කලාකරුවෙකුගෙන්ම මම ඒ දර්ශනය දකිනවා. අපි කථා කළ ආනන්දීයන් බොහෝ දෙනෙක් පුරෝගාමීන්. කැමරාකරණයෙන්, රංගනයෙන් , චිත්‍රපට නිර්මාණකරණයෙන් ඔවුන් විශිෂ්ටයන්. පළමු පාසල් චිත්‍රපටය හැදුවේ ආනන්දයේ ඒ හැමෝම නව මං සොයා ගිය අය. එය ආනන්දයට විශේෂයි. මෙය අතිශෝක්තියක් නෙවෙයි. මෙවැනි පුරෝගාමීන් පිරිසක් වෙනත් පාසලකින් බිහි වෙලා නෑ. අනික් අතට මේ කියවෙන්නේ ආනන්දයේ සංස්කෘතිය විදුහල්පතිවරුන්ගෙන් ගුරුවරුන්ගෙන් ඊට ලද සහයෝගය, විශේෂයෙන්ම පේරුසිංහ සර් ගේ කාලේ රාජපක්ෂ සර් ගේ කාලේ තමා පළමු පාසල් කෙටි චිත්‍රපටය හා පළමු වෘත්තාන්ත චිත්‍රපටය බිහිවන්නේ එයත් ඇත්තෙන්ම විශේෂයි.

ප්‍රශ්නය: ශ්‍රී ලංකාවේ සිනමාව විශාල පරාසයක විහිදෙනවා තිර රචනය, චිත්‍රපට ගීතය, සංගීතය, කැමරාකරණය, ආදී අංශයන් සලකා බලද්දී ආනන්දියන්ගෙන් වැඩිම වටිනාකම එකතු වූ අංශය විදිහට ඔබ දකින්නේ කුමක්ද?

එහෙම බැලුවහම අංශ කිහිපයක්ම තියනවා. පුරෝගාමී අංශය විදිහට අපි බැලුවොත් අධ්‍යක්ෂණය. කවදාවත් බිඳිය නොහැකි වාර්ථා ආනන්දීයන් අධ්‍යක්ෂණයෙන් තියලා තියනවා. පාසල් ශිෂ්‍යයන් කළ පළමු චිත්‍රපටය, ඩී.බී.නිහාල්සිංහයන් චිත්‍රපට කැමරාකරණයට දුන් පුරෝගාමීත්වය. කිසිවකුට සමකරන්න බැහැ. පළමු සිංහල සංස්කරණ ශිල්පියා හැටියට ටයිටස් තොටවත්ත මහතා තැබූ පියවර විශිෂ්ටයි. ඊට පෙර සංස්කරණයෙහි නිරත උනේ ඉන්දියානුවන්. කේ.ඒ ඩබ්ලිව්. පෙරේරා පොදුජන සිනමාකරු විදිහට ඇගයෙනවා. ඒ වගේම ජනප්‍රිය ධාරාවේත් බල කණු ආනන්දයෙන් බිහි වී තිබෙනවා. ජෝ දේව් ආනන්ද්, කේ.ඒ ඩබ්ලිව්.පෙරේරා සිනමාකරුවන් ජනප්‍රිය ධාරාවේ විශිෂ්ටයන්. අනෙක් අතට කලාත්මක ධාරාවේත් විශිෂ්ටයන් අප සතුයි. නිහාල්සිංහයන්, ටයි මහත්තයා වගේ අය අයිති වන්නේ කලාත්මක ධාරාවට. සෝමපාල රණවීර, ටී.බී.සෙනවිරත්න වගේ අය සිනමා පුවත්පත් කලාවට පුරෝගාමීත්වය සපයනවා. මේ සාකච්ඡාව කරන්නේ මම හින්දා නුවන් නයනජිත්ව, මාව පැත්තකින් තිබ්බත් ආනන්දීයකු අතින් තමයි ශ්‍රී ලංකාවේ සිනමා වංශය ලියවෙන්නේ. ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයකින් සිනමාව ගැන පුරෝගාමී අචාර්ය උපාධියක් ගන්න පළමු වැන්නා ආනන්දීයෙක්. චිත්‍රපට සංගීතයේත් විවිධ ආරයන් ජන ගී , බටගිර ආර , ජනප්‍රිය ගීතය, දේශීය සංගීතය, මේ සියලු ධාරාවන් වල අපේ විශිෂ්ටයන් ඉන්නවා. අනෙක් අතට ඩී.බී. නිහාල්සිංහයන් අපි සලකන්නේ ශ්‍රී ලංකාවේ බිහි වූ ශ්‍රේෂ්ඨ පරිපාලකයෙක් විදිහට, ජාතික චිත්‍රපට සංස්ථාවේ සාමාන්‍යාධිකාරීවරයා විදිහට කළ කාර්යභාරය, සුමිත්ත අමරසිංහ මහතා සභාපති විදිහට කළ කාර්යභාරය, ඊ.ඒ.පි.එදිරිසිංහ මහතා වගේ අය චිත්‍රපට ප්‍රදර්ශන ක්ෂේත්‍රයේ අති විශිෂ්ටයන්. එනිසා ආනන්දය සෑම ක්ෂේත්‍රයකම විශිෂ්ටභාවය හා පුරෝගාමීත්වය ගොඩනගලා තියනවා.

ප්‍රශ්නය: සිනමා විචාරයේදී ආනන්ද දායකත්වය ඔබ දකින්නේ කෙසේද?

සිනමා පුවත්පත් කලාවට පුරෝගාමීන් ආනන්දයෙන් බිහිකරල තියනවා ටී.බී. සෙනවිරත්න, සෝමපාල රණවීර වගේ අය ඔවුන් සිනමා විචාරකයන් නොවුනට ඊට ප්‍රවේශය හදන සිනමා පුවත්පතට මුලිකත්වය ගත්තා. එහිදී සිනමාව ගැන කතා බහක් ආරම්භ කළා. ඊට පස්සේ සිනමා පුවත්පත් ස්ථාපිත වීමට පටන් ගැනීමත් සමග රෙජි සිරිවර්ධන වැන්නන් විචාර කලාවට ප්‍රවේශ වනවා.ඊට ආනන්දයෙන් පුරෝගාමීත්වය දැක්වුයේ ඔහුයි. ඔහු ඉංග්‍රීසි සිංහල ද්වි භාෂාවෙන්ම ලියන්නට දක්ෂයෙක්. අරුණ ගුණරත්න, සුනිල් මාධව ප්‍රේමතිලක, ටයි මහත්තයා වගේ අයත් වෙනත් ක්ෂේත්‍ර වල හිටියට සිනමා විචාර ලිපි ලියල තියනවා. ඉන් පසුව අපිත් රෙජි සිරිවර්ධන මහතා වැන්නන් කථා කළ සිනමා විචාරය ආනන්දීයන් විදිහට පෝෂණය කරනවා. ඒ වගේම විදර්ශන කන්නන්ගර , බූපති නලින් නුතන සිනමා විචාරය විවිධ මානයන් ඔස්සේ ඉදිරියට ගෙනයන ආනන්දීයන් විදිහට හඳුනාගන්න පුළුවන්.

ප්‍රශ්නය: අනාගතයේදී ගොඩනැගිය යුතු යහවාදී සිනමාව වෙනුවෙන් වර්ථමාන ආනන්දීයන්ගේ වගකීම කෙබඳු විය යුතුද?

මම මේ දවස් වල ලියන ආනන්ද විද්‍යාලයීය වංශය කියන පර්යේෂණාත්මක කෘතිය ලියන්නෙත් ඔය අරමුණ වෙනුවෙන් තමයි. අපේ කොල්ලන්ට මේ අනාගත අවශ්‍යතාවය කා වද්දන්න. ප්‍රධානවම මම මෙහෙම දෙයක් දකිනවා ආනන්දීයෙක් නිර්මාණයක් කරනවානම් ඔහුට වගකීමක් තියනවා අපේ අනන්‍යතාවය ආරක්ෂා කිරීමට. පරණ වාඩියේ හෙළ බොදු තක්සලාව පසුව නම්වන්නේ ආනන්ද හාමුදුරුවන්ගේ නමින් නේ. අපේ ඉතිහාසය ගත්තහම ගුණානන්ද හාමුදුරුවෝ , සුමංගල හාමුදුරුවෝ කැමති උනේ නෑ තමන්ගේ නම දානවට. උන් වහන්සේලා එකහෙලා ඉල්ලා සිටියේ ධර්ම භාණ්ඩාගාරික ආනන්ද හාමුදුරුවන්ගේ නම යොදන්න කියලා. මේ සියල්ල වටා අපිටම ආවේනික සංස්කෘතියක් තියනවා ඒ නිසාම මේ සංස්කෘතිය කිසිම කලාවකින් නොකෙලසී පවත්වා ගැනීමේ අයිතිය සියලු ආනන්දීයන්ට තියනවා. මම විශ්වාස කරනවා අපි චිත්‍රපටයක් කළත්, වෙනත් නිර්මාණයක් කළත් අපිට අයිතියක් නෑ, ලංකාවේ ප්‍රධාන සංස්කෘතික ධාරාවට පහර දෙන්න. ජාතික කලා පදනම ගැන අවබෝධයක් අපේ නිර්මාණකරණයේදී අපිට තිබිය යුතුයි. මම මේ නිර්මාණ කුඩා රාමුවකට කොටුකරන්න දරන උත්සාහයක් නොවේ. ආනන්දීය අපට අගනාකම් ටිකක් තිබුනා. අපි මල් පූජාව තියලා, බුදු පිළිම වහන්සේ ඉදිරියේ අධිෂ්ටාන කරගෙන ධම්මපදය, පාසල් ගීය, ජාතික ගීය ගයපු උදෑසන වැඩසටහනක් තිබෙන පාසලක්. ඒ වටා ආනන්දීය අපිට ගොඩනැගුනේ මහා චින්තනයක්. මම ඉගෙන ගන්න කාලේ අපේ විදුහල්පතිතුමා තමයි ඒ.පී.ගුණරත්න සර්. එතුමගේ හැම කතාවකම පොදු වූ වචන කීපයක් තිබුනා "ආනන්දය කියන්නේ ශුද්ධ භූමියක්, ආනන්ද චින්තනය රකින්නේ නැති ශිෂ්‍යයන්ට මට කියන්න පුළුවන් ලොකුම කුණුහරුපය තමයි ද්‍රෝහීන් කියන එක" ඒ කතාව සියයට ලක්ෂයක් ඇත්ත. අපි චිත්‍රපට නිර්මාණ කළත් ගීත නිර්මාණ කළත් මාධ්‍ය භාවිතා කළත් පළමුව අපි හිතන්න ඕනේ එය අපේ දහමට පටහැනිද එය අපේ භාෂාවට අගතියක්ද මාපිය දූ දරු සම්බන්ධයට බලපාන විදිහ, ගුරු සිසු සම්බන්ධයට බලපාන ආකාරය, අපේ පවුල් සංස්ථාවට බලපාන අකාරය , වෙනත් වාර්ගිකයන්ට බලපාන අකාරය ,අපේ සාරධර්ම වලට අගනාකම් වලට බලපාන ආකාරය. මේ ගැන නොසලකා කරන අත්හදා බැලීම් නොකිරීම අනාගත නිර්මාණකරණයේදී සිතිය යුතු දෙයක් කියලා මම විශ්වාස කරනවා.

සිනමාවේ අනඳ සලකුණු සොයා යාමේදී අපට හැගෙනුයේ ආනන්දය ශ්‍රී ලාංකේය සිනමාව සුපෝෂිත කරන්නට ඉමහත් මෙහෙයක් ඉටුකර ඇති වගය. අනාගත ආනන්දීයන්ගේ වගකීමද ආනන්ද හර පද්ධතීන් බිඳ නොහෙළන ගුණාත්මක නිර්මාණකරණයක නිරත වීමයි. අද අප සමග සොඳුරු අතීතාවර්ජනයක නිරත වූ අචාර්ය නුවන් නයනජිත් කුමාර මහතාට අතීත අනඳ ශක්තිය පර්යේෂණාත්මකව අත්විදීමින් අපිට සමීප කිරීම වෙනුවෙන් ආදී ආනන්දීය අපගේ ගෞරවය පුද කරමු.

ස්තුතියි ඔබට...

**සටහන: චාමර අසංග කපුගේ**

# ACTIVITIES OF AFFILIATED GROUPS

**Old Anandians' 70-75 Group (Activities during First Three Quarters of 2023)**

Old Anandians' 70 75 Group has carried outfollowing projects and activities during first 3 Quarters of year 2023.

**Annual Religious Activity**

Annual " Bodhi Pooja Pinkama" was held in 2nd week of February 2023 to pass on merits to Past Principals, Teachers and Members who depart from us & also to share the spirit of friendship & harmony and invoke blessings to family members of the Group.

**Blood Donation 2022 - (Annual Event)**

Ananda 70 75 Group did organize the Blood Donation campaign for the 24th time. The event was held at College Premises on 25th January 2023 with the participation of the President of ACOBA Mr.Bimal Wijesinghe. There were 81 blood donors attended.

**Members Welfare**

To strengthen the fellowship among group members and to enhance the bond between families of the group members, the annual Peduru Patiya was organized by the Group on 20th of May 2023 at Solis Reception Hall, Pitakotte with the participation of Principal Mr.Lal Dissanayaka, President of ACOBA Prof. Athula Kaluarachchi and many more past Presidents of ACOBA and 120 Participants.

**Fund Raising**

Under the fund raising projects, due to the demand from the fellow Anandians the group has repeated doing Tie pins and Cufflink with Ananda crest in September 2023 and now they available for sale.

**Future Events**

The Blood Donation for the year 2023 will be held in line with the Olcott Commemoration on Saturday the in 18th of November 2023 from 8.00 am to 2.00 pm at the College Premises.

The AGM of the Group will be held on Friday the 24th of November at the College Siyawasa Hall with the participation of the Principal Mr.Lal Dissanayaka and ACOBA President Prof Athula Kaluarachchi and the Joint Secretaries of the ACOBA.

The "Nena Harasara" Event for the students who excelled at the 2022 Advanced Level Examination in 2022 by obtaining 3As will be held on Thursday the 14th of December 2023.

**2023 Group Activities of Old Anadians' 75-80 Group – Active since 1985 – Incorporated by Act of Parliament**

Our Annual General Meeting for the new year was held on 27th Of January 2023 at All Ceylon Buddhist Congress Auditorium. New President elected by mutual consent of members was Janaka Kurukulasuriya with a Executive Committee consisting of 25 members. Following the AGM was a Fellowship & Dinner at BRC auditorium which was attended by nearly 80 members.

Following activities were held during the year: -

* Annual Buddha Pooja was held on 15th of February at Genelanda Purana Viharaya, Kalalgoda, Thalawathugoda which was attended by nearly 50 members of the Group

* Annual Social Service Project which certain parts were finished by the Group to Kokollai Mixed Tamil Vidhyalam on 27th Of February at Kokillai. On completing the project we invited the school to visit Colombo over weekend to do a tour of Colombo which the School accepted warmly.

* Annual Stag Night was held on 28th of April at Lotus Tower premises including Fellowship & Dinner with an opportunity visit the Observation Deck

* Our new Annual Social Service project will be dedicated to a school in Ampara - Ruhunugam Vidyalaya Dadayamthalawa , with expected expenses in the region of around Two Million Rupees of which all will be contributions from our members & their associated well-wishers.

* Annual Family Trip of the Group members took place at Hotel Citrus Waskaduwa on 26th& 27th of August with the participation of over 50 members & their wives.

* On 10th of September MU/Kokillai Mixed Tamil Vidyalam students visited Colombo. They were taken to the Colombo Museum, Colombo Port City, Lotus Tower, Zoological Gardens & other places of interest. Overnight accommodation was provided at the Hostel premises for which we are very grateful to the Principal Mr Lal Dissanayake. All meal expenses during the visit was borne by Group.

* Our Annual Fund-Raising event the Musical Extravaganza was held on 16th Of September at Grand Monarch Banqueting facilities in Thalawathugoda to an audience of 270+ Guests. The event was "The Annual Baila Night" with the Band "TAXI" & Guest Artists.

* The Pinnacle of 75-80 Group Activities is Annual Teachers Health Camp which was held on 22nd October at College premises. This event was supported by over 80 Doctors who are old boys of our School. Participation of over 300 Past & Present teachers were a very exceptional feature. During the event Morning Meal & Lunch was provided to all. This event was made a success by the participation of Old Anandians' 2012 Group & Old Anandians' Medical Guild. All funding required was self-generated with the help of our members & Old Anadaians' Groups overseas.

In addition,we are providing following Scholarships to needy students of College: -

* 10 X 5000 Rupee monthly educational stipend for Junior School

* 2 X Rs 100,000 + per annum Scholarships for 2 students from rural & needy areas – Sponsorship provided in memory of our member late Priyantha Weersainghe.

* 1 X Rs 20,000 per month Scholarship for a Medical Student (Old Boy of the School) donated in memory of our ex-President Channa Perera for which sponsorship is entirely borne by his wife Mrs Sayuri Perera.


















## ආදි ආනන්දීය 89 කණ්ඩායම

කණ්ඩායමේ සමාජ සත්කාර වැඩසටහන ලෙස අම්පාර අධ්‍යාපන කලාපයේ සියලුම පාසල් සඳහා පවත්වන ක්‍රීඩා තරගාවලිය සඳහා ලබාදෙන රුපියල් ලක්ෂයක් වටිනා සහතිකපත් 1500 ක් ප්‍රදානයකරන ලදි.

89 කන්ඩායමේ නැසිගිය සියලුම සොහොයුරන්ටත් ආනන්දයෙදි අපට අකුරු කල නැසිගිය ගුරු මැණිවරුන්ට පියවරුන්ට පිං අනුමෝදන් කිරීමට සහ සියලුම සාමාජික සොයුරන්ටත් පවුලේ අයටත් නිරෝගී සුවපතා පැවැත්වූ "සදා සමරමු සොහොයුරෝ" බෝධිපුජාව, සර්වඥ ධාතුන් උදෙසා විශේෂ පුජාව සමඟ 2023-05-12 වෙනි දින පවත්වන්නට යෙදුන ගරුතර ස්වාමීන්වහන්සේලා උදෙසා සිදුකෙරෙනු දානමය පුණ්‍යකර්මය.

89 කණ්ඩායමේ ප්‍රජාව්‍යාපෘතියක් ලෙස 2023 අප්‍රේල් මස 9 වෙනි දින පවත්වන්නට යෙදුනු ලේ











**OA 2001 Group :** Future Trails career Program is organized by Old Anandians' 2001 Group under the guidance of Education Subcommittee of the Old Boys Association of Ananda College. This Career Guidance Program was organized for the 7th consecutive time this year as a hybrid event held at the Kularathna Hall with live online streaming of the event for hundreds of student participation. Prominent personalities from Universities and the Corporate world of Sri Lanka participated in the program to discourse and make presentations of their unique life experiences."








**The annual flagship project of Old Anandians 97 Group** –distribution of *"Ananda Siritha"* booklet and memento plant to new Grade 1 students was held on 23rd March 2023. The event was organized in parallel to the welcome ceremony organized forGrade 1 students.

The event comprised a symbolic handing over of th *"Ananda Siritha"* booklet and memento plant to representatives from each class by the Chief Guest and the Principal, followed by the distribution of booklets and plants to the student at class level.







### ආදී ආනන්දීය 97 කණ්ඩායමෙන් තවත් ප්‍රජාසත්කාරයක්....

ආදී ආනන්දීය 97 කණ්ඩාය මවිසින් වාර්ෂිකව සිදුකරනු ලබන විවිධ ප්‍රජා සත්කාරක වැඩසටහන්වලට සමගාමීව මෙවර බප/හො/තලගල ප්‍රාථමිකවි ද්‍යාලයීය දරුදැරියන් වෙනුවෙන් පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහනක් පසුගිය අගෝස්තු මස 30 වන දින බප/හො/තලගල ප්‍රාථමික විද්‍යාලයේදි පවත්වන ලදී.

ආදී ආනන්දීය 97 කණ්ඩායමේ දෙස් විදෙස් සාමාජිකයින්ගේ පරිත්‍යාගයන් අනුව රුපියල් මිලියනයක් පමණ වටිනා පාසල් උපකරණ සහ සපත්තු මෙම දරුවන් වෙනුවෙන් පරිත්‍යාග කරන ලදි. එසේම තලගල ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පතිනියගේ ඉල්ලීමට අනුව දරුවන්ගේ සෙල්ලම් මිදුලට අඩුපාඩුව තිබු උපකරණ සපයා දීමට ලැබීමද අප කණ්ඩායමේ ජයග්‍රහණයකි. පසුගිය අගෝස්තු මස 30 වනදා නිවාඩු දිනයක් වූවද පාසලේ සියළුම දරුවන් තම දෙමව්පියන් සමඟ පාසලට පැමිණසිටියේ ආදී ආනන්දීය 97 කණ්ඩායම උණුසුම් ලෙස පිළිගැනීමට ය. පාසලේ දු දරුවන් මෙන්ම දෙමව්පියන් සඳහා ද වටිනා හෝරා දෙකක් පමණ කාලයක් නිර්මාණය කිරීමට ආදී ආනන්දීය 97 කණ්ඩායමේ හිටපු සභාපති සහන් රන්වල සොහොයුරා ඉදිරිපත්විය.

ඒ අනුව රන්වල බලකාය විසින් දේශීයත්වය සහ නවීනත්වය පිළිබඳව රසවින්දනාත්මක දේශනයක් සිදුකරන ලදී,

එමෙන්ම එම පාසැලේ දරුවන් දෙදෙනෙකුට රන්වල බලකායට සහභාගි වීමට ශිෂ්‍යත්ව 2 ක්ද පිරිනමන ලදි.





## OA 2004

(Leadership Training Programme for primary prefects)

Primary prefects Day is one of a most significant annual events of Primary section which is organizing by Old Anandian's Group of 2004 since year 2019.

In an attempt to taking this event to the next level, we decidedintroduced a leadership training programme called "LEADERS OF TOMORROW" for newly appointed primary prefects.

This event was concluded successfully on 08th September& Primary Prefects day was held on 20th on the same month, with the support of group members and we have

Our very own fellow Anandians, Mr. Thilanga Kaushal Mendis from Old Anandians' 2002 Group and Dr.Gayan Nalaka Jayawardane from Old Anandians Group of 2004, participated as Guest Speakers and shared their valuable experiences and ideas among the young leaders.

Mr. Sujeewa Rathmahal - Vice President of Ananda College Old Boys' Association was joined hand with us on that day, to made the event more valuable and remarkable.

We wish to thank everyone who helped to make this event a success.





Continued to Page No. 26

# සංවේගයෙන් උණුබිඳුමයි...!



1970-1989 දක්වා ආනන්ද විද්‍යාලයේ සේවය කළ හේමලතා අමරතුංග (පැස්කුවෙල්) ගුරු මෑණියන් අවුරුදු 94 ක් ආයු විඳ අප්‍රේල්13 දින අභාවප්‍රාප්ත විය.



1975-1991දක්වා ආනන්ද විද්‍යාලයේ උසස්පෙල විද්‍යා අංශයේ සේවය කළ මානෙල් පෙරේරා ගුරු මෑණියන් අවුරුදු77 ආයුවිඳ පරලෝ සැපත් විය.



1959-1963 දක්වා ආනන්ද විද්‍යාලයේ සේවය කළ ජී.බී.විජේසිංහ ගුරු පියාණන් අවුරුදු 87 ආයු විඳ ජුනි මස 5 වෙනි දින පරලෝ සැපත් විය.



විශිෂ්ට ආදි ආනන්දීයකු වූ හිටපු යුධ හමුදාපති ලයනල් පියනන්ද බලගල්ල මහතා වසර76ක තම දිවිසැරිය නිමකොට පසුගිය ඔක්තෝබර් 26වෙනිදා දැයටසමුදුන්නේය. එතුමා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ16වන යුධ හමුදාපතිවරයා විය.

පාසල් සමයේ වර්ණලාභී දක්ෂ ක්‍රීඩකයකු වූ ඔහු වර්ෂ 1967 දී ශ්‍රී ලංකා යුධ හමුදාවේ සේවයට එක්විය. වසර තිස්අටක තම සේවාකාලය තුල යුධහමුදාවේ ඉහල නිලයන් රැසක වගකීම ඉසිලූ ඒ මහතා, මව් බිම වෙනුවෙන් වූ තම උදාර මෙහෙය නිමකරමින් වර්ෂ 2005දී සේවයෙන් විශ්‍රාම ලැබුවේය.



කීර්තිමත් ආදි ආනන්දීයකු වූ කර්නල් රන්ජිත් විජේසුන්දර හැටහය වසක තම දිවි සැරිය පසුගිය නොවැම්බර් 14 දින නිමකරන්නට යෙදුනේය. ආනන්ද විද්‍යාලයේ පලමු පොලිස් කැඩෙට් සැරයන්වරයා වූ ඔහු රග්බි කණ්ඩායමේ නායකත්වය ද දැරුවේය. වර්ෂ 1978 දී ශ්‍රී ලංකා පාබල හමුදාව සමඟින් එක් වූ ඔහු වසර විසිතුනක තම විශිෂ්ට සේවා කාලය වර්ෂ 2002 දී නිමකරන ලදී.

Continued from Page no. 25

## Projects and programs of the Ananda College Old Hostellers Guild for the year 2023.

1. Old Hostellers Guild Annual General Meeting and Annual Get-Together.
2. Launching of old hostlers guild web site anandaohg.lk
3. Fully renovated the Ananda College Hostel - Senior Boys' washroom.
4. Renovated and fixed the Hostel's direct water supply system to avoid major water leaks.
5. Donated materials for the renovation of the Hostel kitchen area and lobby.
6. Organized the Old Hostellers' Annual Cricket Tournament.
7. Donated canvas shoes to Hostel cadet students.
8. Held an Education Appreciation Awards ceremony for the students who achieved highlighted educational achievements.
9. Donated CFL bulbs, fans, and bed linens to students and uniforms for Hostel kitchen staff.
10. Conducted several motivation program for students by distinguished old hostlers.



11. Replaced the Hostel's damaged doors and window glasses.
12. 'Who am I " results coaching session by qualified results coach and distinguish old AnandianIndika Ramachandra for grade 11 students.




## Old Anandians' Medical Guild (OAMG)


1. **Ananda Medical Center -** The Medical Center is fully functioned and maintained by the Old Anandians' Medical Guild providing medical services to the staff and students at Ananda College on every school day. First Aid, basic injury care and emergency care, health promotion &education, health screening and check-ups at health campaigns and special events, issuing Sports Medical Certificates for participants of relevant sports events are some of the leading activities of Ananda Medical Center.
2. **Motivational & Support Programmes**–"Advanced Level Biology Section - Motivational Programme 2023" - Advanced Level Biology Section Motivational Program 2023 was held at the Kularathna Hall of Ananda College on 31st March 2023.
3. **Old Anandians' Medical Guild Academic Sessions – 2023 -** The Academic Sessions 2023 was successfully conducted on 15th July 2023 at Waters Edge, Colombo which was proudly organized by the Old Anandians' Medical Guild (OAMG). OAMG Academic Sessions 2023 was a great opportunity to meet medical professionals from different disciplines while sharing knowledge and experiences in the profession as a part of our continuous medical education (CME) programme. The funds generated through this event are utilized for the maintenance of 'Ananda Medical Center' which provides total free health services to school children and the staff of Ananda College and for other health related, and educational activities organized by the Old Anandians' Medical Guild.
4. **Teachers' Medical Camp – 2023 -** The Teachers' Medical Camp 2023 was held on 22nd October 2023 at the school premises with the participation of more than 250 present & past teachers of Ananda College.It was conducted for the 27th time as a collaboration of Old Anandians' Medical Guild , Old Anandians' 75-80 group, and Old Anandians' 2012 group.
5. **Medical Coverage for Events of Ananda College -** The Medical Professionals of Old Anandians' Medical Guild provide medical and healthcare coverage for school events held around the year organized inside school premises and outside. It consists of first-aid and emergency care with medical expertise, guidance and providing medicines and equipment. Qualified medical doctors cover the events, and all these services are provided free of charge.
6. **Way forward for OAMG**
   - Expand services given at the New Medical Center at "Sathmahala" Building with improved facilities for healthcare delivery and telemedicine.
   - Development of an Electronic Health Record System to provide continuity of care and accountability of care.
   - Healthy Lifestyle and Nutrition Promotion for students & staff of Ananda College.
   - Alcohol, Tobacco & Drug Prevention Awareness Programmes with stakeholder collaboration.
   - Psychological Health Promotion, Motivational & Support Programmes for students & staff of Ananda College. Visit www.oamg.lk for more information.















Continued from page No. 18



**Ananda College emerges National Champions in English debating**

The English debating team of Ananda College emerged as National Champions at the 18th Sri Lanka School's National Debating Championship organised by the Debating Society and Moot Court of the Faculty of Law University of Colombo in association with the Sri Lanka Debater's Council.

The tournament is considered as the high point of the local English debating circles and featured **54** teams from all over the island including Government and international schools.



සංස්කෘතික කලා කටයුතු අමාත්‍යංශය මගින් සංවිධානය කල බස්නාහිර පළාත් නිවේදන තරඟාවලියේදී ජ්‍යෙෂ්ඨ අංශයේ ප්‍රථම ස්ථානය සහ හොඳම ප්‍රවෘත්ති නිවේදකයා ලෙස ආනන්ද විද්‍යාලයේ රම්රු යශේන් ශිෂ්‍යයා සම්මානයට පාත්‍ර විය. ජීව විද්‍යා අංශයෙන් උසස් පෙළ හදාරන රම්රු, ප්‍රවෘත්ති විකාශන ඒකකයේ සමාජිකයෙකි.

SLIIT UNI

THE KNOWLEDGE UNIVERSITY

KANDY UNI

NORTHERN UNI




MALABE CAMPUS




NORTHERN UNI



KANDY UNI

# THE FUTURE AWAITS YOU!